ස්ථානීය පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම
(SSE & SMP)

# නාය ස්ථානය අංක 25
# වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය,
# 23+100, 23+210 අතර කොටසේ දකුණු පස බෑවුම
# කෑගල්ල දිස්ත්‍රික්කය - ගොනු අංක 4

2018 ඔක්තෝබර්

ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
(AIIB)


**සැකසුම:**
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර
කොළඹ 05

*Tel: 011-2588946, 011-2503431, 011-22500354*

# පටුන

.1හැඳින්වීම....1

2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය....1

3. නායයෑම් ව්‍යසනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු....2

4. පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග....4

5. නාය ප්‍රදේශය සහ නාය අවට ප්‍රදේශය පිළිබඳ විස්තර සහ වර්තමාන අවදානම් මට්ටම....4

6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්වන අවට පරිසරයේ සංවේදී ඒකකයන් පිළිබඳව කෙටි හැඳන්වීමක්....5

7. ව්‍යාපෘතිය යටතේ යෝජිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන්....5

8. ව්‍යාපෘති ප්‍රදේශයේ කාර්යයන් හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම....5

8.1 හිතකර බලපෑම්....5

8.2 අහිතකර බලපෑම්....5

8.2.1 ඉඩම් වලට හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා පිවිසුම් මාර්ග අවහිර වීම....6

8.2.2 ශාක හා සත්වයින්ට සිදුවිය හැකි පාරසරික හා ජීව විද්‍යාත්මක බලපෑම....6

8.2.3 ප්‍රදේශයේ ජලවහන රටාවට සිදුවිය හැකි බලපෑම....6

8.2.4 පාංශු ඛාදනයේ බලපෑම සහ ගංගා පතුල වෙනස්වීම්....6

8.2.5 ඉදිකිරීම් කටයුතු නිසා සිදුවන ජල දූෂණය මගින් ඇතිවිය හැකි බලපෑම්....6

8.2.6 ඉදිකිරීම් කාලසීමාවේදී අක්‍රමවත් (එළිමහන් ස්ථාන) වැසිකිලි භාවිතය නිසා ජලය මගින් සිදුවිය හැකි ලෙඩරෝග බෝවීම....6

8.2.7 පහල ගංගා ප්‍රදේශයේ ජලය පරිභණයය කරන්නන් හට ඇතිවිය හැකි බලපෑම්....7

8.2.8 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු....7

8.2.9 වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම්....7

8.2.10 ඉදිකිරීම් වලදී ඇතිවන ශබ්දය දූෂණය, කම්පන, පිපිරීම් වැනි බලපෑම්, හේතුවෙන් ගොඩනැගිලි වලට හා යටිතල පහසුකම් වලට ඇති විය හැකි හානි....7

8.2.11 වැඩබිමේ සේවකයන් හා අවට ප්‍රදේශවාසීන් අතර ඇතිවියහැකි නොසන්සුන් තත්වයන්....7

8.2.12 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්....7

8.2.13 ඉදිකිරීම් අතර තුර ප්‍රදේශවාසීන් වැඩ බිමට ඇතුළු වීම හේතුවෙන් ඔවුන්ට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් තත්වයන්....7

8.2.14 පුපුරන ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය....8

8.2.15 ඉදිකිරීම් කටයුතු අතරතුර සිදුවන මාර්ග තදබදය සහ පදිකයින්ගේ ආරක්ෂාව....8

8.2.16 ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව....8

9. මහජන උපදේශයනය - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්....8

9.1පාර්ශවකරුවන් සමග පැවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකගතාවයන් හා නිර්දේශයන් (යොමුව: ඇමුණුම III)....8

10.විශේෂිත පාරසරික හා සමාජීය බලපෑම්: ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විශේෂිත ක්‍රියාමාර්ග හෝ මැදිහත් වීම් අවශ්‍ය වන සමාජ, පාරිසරික බලපෑම් හෝ අවදානම් ඇතිවන අංශයන්.8

10.1 ජලය සහ තෙත් බිම් සඳහා ඇති බලපෑම් (ඇල මාර්ග, ගංගා හා අනෙකුත් ජල ධරයන් විශේෂයෙන් ඉදිකිරීම් ස්ථානයෙන් පහල ගංගා ප්‍රදේශ අපවිත්‍ර වීම් හා එහි තත්වය වෙනස්වීම නිසා ඇතිවන ගැටළු). නායයාම් ස්ථානය ඉදිකිරීම / පිළිසකර කිරීම තුලින් ඇතිවන දිගුකාලීන බලපෑම් සහ විය හැකි බලපෑම් ....... 8
10.2 බාදන ක්‍රියාවලිය ආශ්‍රිත බලපෑම් හා ගංගා පතුලේ සිදුවන වෙනස්වීම් ....... 8
10.3 ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා වන බලපෑම් (විශේෂයෙන් මාර්ග හා දුම්රිය මාර්ග තාවකාලික අවහිර වීම, රථවාහන තදබදය පිළිබඳ අවදානම) ....... 9
10.4 පොදු සේවා සැපයීමේදී පහල ප්‍රදේශයට සිදුවන බලපෑම (ජල සැපයුම, අපද්‍රවය ඉවත් කිරීම, විදුලිය සැපයීම, ආදිය) ....... 9
10.5 නාය ස්ථානයට යාබදව හෝ ආසන්නයේ ඇති ඉහල අවදානමක් සහිත හෝ මධ්‍ය පරිමාණ අවදානමක ජීවත් වන ගෘහ ඒකක (ඉහළ බෑවුම, පහළ බෑවුම, පහළ ගංගා ප්‍රදේශය යන ආදිය) ....... 9
10.6 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන ....... 9
10.7 ස්ථානයට අසලින්ම පිහිටි ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන ....... 9
10.8 වැඩ බිම තුලට සාමාන්‍ය පුද්ගලයින් ඇතුළු වීමේ හෝ එම ප්‍රදේශය හරහා ගමන් කිරීමේ අවශතාවය ....... 9
10.9 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබධ ගැටළු සඳහා වන ප්‍රමුකත්වය: කොන්ත්‍රාත්කරු වන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබද කරුණු ....... 9
10.10 ළමා ශ්‍රම සහ බලහත්කාරී ලෙස ශ්‍රම ලබා ගැනීම ....... 10

11. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ විරෝධතා නොමැති බව ....... 10

11.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ....... 10
11.2 තෝරාගත් නායයෑම් සිදුවූ ස්ථානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වතු සමාගම් ඉඩම් හිමියන්ගෙන් අනුමැතිය ලබා ගැනීම ....... 10

11.3 මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා ගැනීම ....... 10

11.4 අනෙකුත් අනුමැතීන් ....... 10
11.5 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබා ගැනීම / නෛතික බැදීම්/ විරුද්ධත්වයක් නොමැති වීම ....... 11

12.පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP) ....... 12

12.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ....... 12
12.2 මහජනතාව ඉවත් කිරීම ....... 12
12.3 හානි ව්‍යුහයන් සහ යටිතල පහසුකම් ඉවත් කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය ....... 12
12.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපල / භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ඉල්ලා සිටීම ....... 12
12.5 පහත දැක්වෙන ක්ෂේත්‍ර සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබාදීම ....... 12
12.6 සැලසුම් මත පදනම් වූ පරිසරික / සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් ....... 12
12.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම ....... 14
12.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරු වන්ගේ අවශ්‍යතාවයන්, පාරිසරික හා සමාජ කළමනාකරණය ප්‍රමිතීන් වලට අනුකූල වීම ....... 14
12.8 නාය ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම ....... 16

13. ව්‍යාපෘති ස්ථානය අධීක්ෂණය කිරීම ....... 19

14. දුක්ගැනවිලි වලට සවන් දීම ........................................................................................20
15. තොරතුරු අනාවරණය කිරීම ........................................................................................20

## ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම I: ව්‍යාපෘති ප්‍රදේශයේ ඩ්‍රෝන ඡායාරූපය .......................................................................i
ඇමුණුම II: ආපදා තත්ත්වයේ ස්වභාවය හා උපදේශන අවස්ථා........................................................ ii
ඇමුණුම III : පාර්ශ්වකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා වලදී අනාවරණය වූ කරුණු ............................ iii
ඇමුණුම IV: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රමවේදය ........................................................................................iv
ඇමුණුම V: අධ්‍යන කණ්ඩායම........................................................................................iv
ඇමුණුම VI: යොමු සටහන් ලැයිස්තුව ........................................................................................iv

## රූපසටහන් ලැයිස්තුව

රූපය 1: යෝජිත නායයාම් අවම කිරීමේ ස්ථානයේ ඡායාරූපය .යොමුව: වැඩිදුර අධ්‍යනය සඳහා ගුවන් ඡායාරූපය ඇමුණුම 1 ට ඇතුලත් කර ඇත. ........................................................................................2
රූපය 2a: මාර්ගයේ ඉහළ බැවුම සහ නායයෑම ........................................................................................3
රූපය 2b: මාර්ගයේ පහළ බැවුම ........................................................................................3
රූපය 2c: පාදම ප්රදේශය තුළ දිවෙන ජල සැපයුම් නල මාර්ගය........................................................3
රූපය 2d: පාදම ප්රදේශය තුළ තිබෙන අවදානම් සහිත නිවාස ........................................................3
රූපය 3: වර්තමානයේ අවධානමට ලක්වී ඇති බෑවුම් ප්රදේශයේ සහ නිවාසවල රූපමය නිරූපණය ...... 4

## වගු ලැයිස්තුව

වගුව 1: අනුමැතීන් ලබා ගැනීම සඳහා නියමිත කාල නියමය ........................................................11
වගුව 2: සැලසුම් අදියරයේදී පාරිසරික හා සමාජතත්ව සලකා බැලීම් ........................................13
වගුව 3: ES & HS සමඟ අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාව ........................................15
වගුව 4: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනුලබන පියවර ........................................................16
වගුව 5: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර........................................................19
වගුව 6: තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම ........................................................20
වගුව 7: තොරතුරු රැස්කර ගැනීම සඳහා සම්බන්ධ කරගත් ආයතන සහ නිලධාරීන් ..........................21

\

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යයම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශීය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවී දෙපාර්තමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසර හා සමාජ ආරක්ෂණ<br>Environmental Health & Social |
| E & SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ අංශයේ පාරිසරික සමාජ ආරක්ෂණය<br>Environmental & Social Unit of Project Management Unit |
| E & S & H & S unit of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජ සහ සෞඛ්‍යය සහ ආරක්ෂක ඒකකය<br>Environmental & Social & Health & Safety Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| ESMP | පාරිසරික සමාජ කළමනාකරණ සැලැස්ම<br>Environmental Social Management Plan |
| SSE & SMP | නිශ්චිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම<br>Site Specific Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරී<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>Geological & Mines Bureau |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>National Building Research Organization |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය<br>Road Development Authority |

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මූල්‍ය ආධාර මත ශ්‍රී ලංකාවේ පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක නාය යෑම් සිදුවන සථාන පිළිසකර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් AIIB බැංකුවේ හා ලංකා රජයේ නීතිරීතිවලට අනුකූලව සිදුවිය යුතුය. ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් AIIB බැකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවක් (ESMF) සකසා ඇත.

පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවහි (ESMF) අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබද මාර්ගොපදේශයන් සැපයීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්; ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා.ගො.ප.ස.) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරණු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව, ව්‍යාපෘතියට අදාල පාර්ශවයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික , සමාජ , සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන එබැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්වයන් පිළිබද අවධානය යොමු කිරීම වැදගත් වේ. එමනිසා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජයීය ඇගයීම් සඳහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා (SSE & SMP) සකසා ඇත. එම ස්ථානයේ විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිළිබද සැළසුම් මගින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන්, සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්භන්දයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබද ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබාදෙනු ඇත.

කෑගල්ල දිස්ත්‍රික්කයේ වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගයේ 23+100, 23+210 අතර කොටසේ දකුණු පස බෑවුමේ නායයාම අවම කිරීම සඳහා යෝජිත ආපදා ස්ථානයකි. එම ස්ථානය සඳහා විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්මක් සකස් කර ඇත. ගැඹුරු පාරිසරික හා සමාජ අධ්‍යනයකින් පසුව මෙම සැලැස්ම සකස් කර ඇත.

I. ව්‍යාපෘතියට අදාල කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම.
II. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම.
III. හානිය අවම කරන පියවර යෝජනා කිරීම.
IV. මෙම ව්‍යාපෘතියට අදාල වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම.
V. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර අදාළ පාරිසරික නියාමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම.

## 2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය

ස්ථාන අංක 25, ගොනු අංකය-4, කෑගල්ල දිස්ත්‍රික්කය, වේයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගය දකුණු පස 23+100, 23+210 අතර කොටස අසල නායයාම

ස්ථානීය තොරතුරු

i. සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුම්බලියද්ද ග්‍රාම නිලධාරී වසම් යටතේ පරිපාලනමය කටයුතු සිදු කෙරේ. ගෝනගල්දෙනිය ප්‍රදේශයේ රුවන්වැල්ල-වේයන්ගොඩ මාර්ගයේ (B445) දකුණු පස 23+100, 23+210 අතර කොටසේ මෙම බෑවුම් අස්ථාවරත්වය පිහිටා ඇත.
ii. මෙම ස්ථානයට ආසන්නතම නගරය වන්නේ රුවන්වැල්ල නගරයි, එය 8.5 km ක් පමණ දුරින් පිහිටා ඇත.
iii. ස්ථානීයයේ GPS අගය 7.060212N, 80.202799 E. (යොමුව: රූපය 1. ස්ථානයේ ගූගල් ඡායාරූපය.)
iv. ඉඩම් හිමිකාරීත්වය මාර්ග සංවර්ධන අධිකාරියට සහ පෞද්ගලික ඉඩම් වේ.




රූපය *1:* යෝජිත නායයාම් අවම කිරීමේ ස්ථානයේ ඡායාරූපය .යොමුව: වැඩිදුර අධ්‍යනය සඳහා ගුවන් ඡායාරූපය ඇමුණුම *1* ට ඇතුලත් කර ඇත.

### 3. නායයෑම් ව්‍යසනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු

2017 වර්ෂයේ මැයි මස 26 දින මි.මී. 300 ට වඩා වැඩි වර්ෂාවත් සමඟ රුවන්වැල්ල - නිට්ටඹුව මාර්ගය පුළුල් කිරීම සඳහා සිදුකරන ලද ඉංජිනේරුමය නොවන බෑවුම් කැණීමක් හේතුවෙන් බෑවුම් අස්ථායීතාවයක් මාර්ගය දිගේ පැතිර ගියේය. පස්/සුන්බුන් මගීන්ගේ ගමන් මාර්ගයට සම්පූර්ණයෙන්ම බාධා කරමින් මාර්ගය පුරා පැතිර ගියේය. මෙම දිගු අස්ථායී බෑවුම් කඩාවැටීම කලින් කලට ඇතිවන අධික වර්ෂාපතනයන් සමග සිදුවේ.

**සිදුවූ හානියේ ස්වාභාවය**

කඩාවැටුණු සුන්බුන් (පාංශු හා පාෂාණ) ස්කන්ධය මාර්ගයට පමණක් සීමා වූ අතර, බෑවුම පහළට පැමිණ නැත. පහළ බෑවුමේ නිවාස පිහිටා ඇති අතර ඒවාට නායයෑමෙන් කිසිදු බලපෑමක් සිදුවී නැත. කිසිදු තුවාලකරුවෙක් පිලිබඳවද වාර්තා වී නොමැත.

| | |
|---|---|
|  |  |
| රූපය 2a: මාර්ගයේ ඉහළ බෑවුම සහ නායයෑම | රූපය *2b:* මාර්ගයේ පහළ බෑවුම |
|  |  |
| රූපය *2c:* පාදම ප්‍රදේශය තුළ දිවෙන ජල සැපයුම් නල මාර්ගය | රූපය *2d:* පාදම ප්‍රදේශය තුළ තිබෙන අවදානම් සහිත නිවාස |

රූපය 2: ප්‍රදේශයේ දල රූප සටහන




රූපය *3:* වර්තමානයේ අවධානමට ලක්වී ඇති බෑවුම් ප්‍රදේශයේ සහ නිවාසවල රූපමය නිරූපණය

## 4. පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග

නායයෑමෙන් පසු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මෙම ස්ථානය පරීක්ෂා කර වාර්ථාවක් පිලියෙල කරන ලදී (NBRO/LRRMD/KG/RWP/L117/31 /30080).

**ඉවත් කිරීම්**

පහත සඳහන් ලක්ෂණ බෑවුමෙහි පෙන්නුම් කලහොත් අධි අවදානම් ලෙස වර්ගීකරණය කර ඇති නිවාස වලින් එහි නිවැසියන්ට ඉවත් වන ලෙසත් ග්‍රාම නිළධාරීතුමාට සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීතුමාට පහත ලක්ෂණ පිළිබඳව පරීක්ෂාකාරීව සිටින ලෙස දැනුම් දෙන ලෙසත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාව දක්වා ඇත.

- උල්පත් ජලය මඩ පැහැයෙන් යුක්ත වීම
- ඉහල බෑවුම් ප්‍රදේශයේ පිපිරීමට ඉඩ ඇති නව ආතති ඉරිතැලීම් හෝ පුළුල් වීම
- ඉහල බෑවුම් ප්‍රදේශයේ ශාක ඇල වීම

නිවාස වලින් කිසිවකු ස්ථිර ලෙස ඉවත් නොකෙරුණත් අධික වර්ෂාපතනයක් ඇති අවස්ථාවලදී අනතුරු ඇඟවීමේ සලකුනු පිළිබඳව ඉතා සුපරීක්ෂාකාරී වන ලෙස දන්වා ඇත.

## 5. නාය ප්‍රදේශය සහ නාය අවට ප්‍රදේශය පිළිබඳ විස්තර සහ වර්තමාන අවදානම් මට්ටම

මෙම ප්‍රදේශය  බෑවුම් සහිත ප්‍රදේශයකි. ඉහල බෑවුමෙ  විශාල ප්‍රදේශයක පැතිරුනු රබර් වගාවක් සහිත දළ බෑවුමක් වන අතර පහල බෑවුම් ප්‍රදේශය සාපේක්ෂ වශයෙන් අඩු බෑවුම් සිට පැතලි බිමක් බවට පත් වේ. පහළ බෑවුම් ප්‍රදේශය තුළ නිවාස සහ ගෙවතු වගා විසිරී පවතී. රුවන්වැල්ල සිට වේයන්ගොඩ දක්වා මාර්ගයක් මෙම ප්‍රදේශය හරහා ගමන් කරයි.

පහල බෑවුමේ ඇති ගෙවතු වගාවන්හි හොඳින් වැඩුනු ශාක ආවරණයකින් යුත් අවම වශයෙන් වියන ස්ථර දෙකක්  සහ වගුරුබිම් මෙන්ම පහල ප්‍රදේශයේ රබර් වගාවන්ද දක්නට ලැබේ. පහල බෑවුමේ මාර්ගයට සමාන්තරව ගලා බසින ස්වභාවික ගංගාවක් ඇත.

මාර්ගයේ මීටර 150 ක් පමණ දිගට වැටී තිබෙන ඉහල බෑවුමේ කැපුම අනාගතයේදී කඩා වැටීමේ අවදානමක් පවතී. අස්ථාවර පාෂාණ කොටස් සහ සුන්බුන් ස්කන්ධයන් නිරාවරණය කරමින් කලින් කලට අධික වැසි අවස්ථාවලදී මෙම පෙදෙස ස්වල්ප වශයෙන් කඩාවැටී ඇත. සට්ටනය වන ලිහිල් වූ පාෂාණ හා ඉරී තැලි ඇති ගල් කැබලි හේතුවෙන් මාර්ගයේ මෙම කොටසෙහි ගමන් කරන මගීන් දැඩි අවදානමකට ලක් වී ඇත.එබැවින් අධික වර්ෂාපතනයේ දී බෑවුමේ අස්ථාවරභාවය සඳහා ඉහළ අවදානමක් පවතී.

ඒ. ඒ. සී. අබේසිංහ මහතාට අයත් නිවෙසට දැඩි අවදානමක ඇත අතර ඒ. ඒ. මිල්ටන් අබේසිංහ, ඒ. ඒ. අමරසේකර, එම්. ඒ. එම්.පී. කරුණාරත්න යන මහත්වරුන්ගේ නිවෙස් වලට මැදි අවදානමක් පවතී. එමෙන්ම එම්.ඒ. කරුණාරත්න සහ ඩී.පී. පී. කරුණාරත්න යන මහත්වරුන්ගේ නිවාස සඳහා මධ්‍යස්ථ අවදානමක් ඇත.

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්වන අවට පරිසරයේ සංවේදී ඒකකයන් පිළිබඳව කෙටි හැඳින්වීමක්

මෙම ප්‍රදේශයේ බොහෝ විට දක්නට ලැබෙන්නේ රබර් සහ ගෙවතු වගාවන් ය. අස්ථායී බෑවුමේ ඉහල ප්‍රදේශයේ පැතිරී ඇති රබර් වගාව අත්හැර දමා ඇති රබර් බිම් කොටසකි. එහි සාර්ථක යටිබිම් වනවගාවක් ඇත. කොස්, කිතුල් සහ කැන්ද වැනි ශාක ගෙවතුවගා වල දක්නට ලැබෙන අතර නායයෑමට ලක්වූ ප්‍රදේශයට මදක් ඉහලින් ඉහල බෑවුම් ප්‍රදේශයෙහි තණකොළ,කුඩා පඳුරු සහිත යටි වෘක්ෂලතා වගාවක් ඇත.

අධ්‍යන ප්‍රදේශය තුළ වනාන්තර බිම්, වනජීවී සංරක්ෂණ, පරිසර හිතකාමී වාසස්ථාන නොමැත. පාරිසරික වශයෙන් සැලකිය යුතු භූමිෂ්ය වාසස්ථාන නොමැත. පාරට සමාන්තරව මීටර් 500 ක් පමණ දුරින් ගලා බසින ස්වභාවික ගංභාවක් පවතී. එහෙත් මෙම ගංගාවෙන් සෘජු ලෙස පෝෂණය වන ජලධාරා මෙම නායයෑමට ලක්වූ බෑවුමේ දක්නට නැත.

ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම නිසා අවදානමට ලක් විය හැකි පාරිසරික සහ සමාජීය අංග:

i. මාර්ග ක්‍රියාකරකම් සහ මගීන් හට බලපානු ඇත
ii. පහල බෑවුම් ප්‍රදේශවල වාසස්ථානයන්හි නිවැසියන් හට බලපානු ඇත
iii. වර්තමානයේ නිවාස සඳහා ජල සැපයුම (බීමට සහ තවත් ගෘහාශ්‍රිත අවශ්‍යතා සඳහා) සපයන නායයෑමට ලක්වූ බෑවුම හරහා දිවෙන නල පද්ධතියට බාධා කරනු ඇත

## 7. ව්‍යාපෘතිය යටතේ යෝජිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන්

යෝජිත හානිය අවම කිරීමේ කාර්යයන් බොහෝ දුරට දුර්වල හා ලිහිල් බෑවුම කොටස් ඉවත් කිරීමට, ජලාපවහන කාණු පද්ධති වැඩි දියුණු කිරීමට හා බෑවුම් ප්‍රතිස්ථම්භනයට යොමුවනු ඇත. මෙහිදී නිවැරදි ජලප්‍රවාහ කලමනාකරණයක් හරහා අවිධිමත් ලෙස මතුපිට ගලා යන ජලය ක්‍රමවත් ජලප්‍රවාහන පද්ධතියක් වෙතට යොමු කිරීම සඳහා ස්ථිර ව්‍යුහයන් ඉදිකිරීම් සිදු කරනු ඇත. අස්ථායී කාන්දු වන ප්‍රදේශයන්හි භූගත ජල මට්ටම අඩු කිරීම සඳහා තිරස් ජලාපවහන පද්ධති ඇතුළත් කිරීම ද ජලාපවහන වැඩිදියුණු කිරීමේ දී සැලකිල්ලට ගනු ඇත. එමෙන්ම ආපදා අවම කිරීමේ කටයුතු වලදී පොලොව මතුපිට ඛාදනය පාලනය කිරීමේ ක්‍රියාකරකම් සමග රැඳවුම් බිත්ති ඉදිකිරීම, පාෂාණ වලට සහ පසට ඇණ යොදා ස්ථාවර කිරීම පිළිබඳ සලකා බලනු ඇත.

## 8. ව්‍යාපෘති ප්‍රදේශයේ කාර්යයන් හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම

### 8.1 හිතකර බලපෑම්

අවම කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් වර්තමානයේ මාර්ගයේ අස්ථායි බෑවුම් ප්‍රදේශ ස්ථාවර වීම මගීන්ගේ සහ පදිකයන්ගේ ආරක්ෂාව සහතික කරනු ඇත. තවද, ආපදා අවම කිරීමේ ක්‍රියාකාරකම් ඉහල අවදානම්, මධ්‍යම අවධානම් සහ මධ්යස්ථ අවදානම් සහිත නිවාසවල නිවැසියන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

### 8.2 අහිතකර බලපෑම්

අවදානම අවම කිරීමේ වැඩ කටයුතු දැනට සාමාන්යයෙන් බෑවුමේ අස්ථාවර වීමෙන් බාධා ඇති වී තිබෙන ප්‍රදේශයකට සීමා වී ඇත. එබැවින්, සෘණාත්මක බලපෑම් බෙහෙවින් ඉදිකිරීම් ප්‍රදේශයට පමණක් සීමා වී පවතී.

**8.2.1 ඉඩම් වලට හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා පිවිසුම් මාර්ග අවහිර වීම**

හානිය අවම කිරීමේ කටයුතු බොහොමයක් මාර්ග සංවර්ධන අධිකාරියෙහි මාර්ග සඳහා වෙන්කරන ලද ඉඩම් හා පුද්ගලික රබර් ඉඩම් වල සිදු කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ දේපලෙහි අනාගත සංවර්ධන අවස්ථාවන් අහිමි වනු ඇත. මෙම රබර් ඉඩම් විවිධවූ වෘක්ෂලතාදියෙන් වැසී පැවතීමෙන් භාවිතා නොකලහැකි තත්වයට පත්වී ඇති අතර එහෙයින් කිසිදු ඵලදායී කටයුත්තක් සඳහා භාවිතයට නොගනී. එබැවින් ඔවුන්ගේ සංවර්ධන අවස්ථාවන් දැනටමත් අහිමි වී ඇත. මෙම ඉඩම් වැඩි අවදානම් ලෙස වර්ග කර ඇති බැවින් අනාගත සංවර්ධනයට ඉඩ නොලැබේ.

පිරිසිදු කිරීමට,සේදීමට සහ පානය කිරීම සඳහා ජල මූලාශ්‍රයක් ලෙස නිවාස කිහිපයක් වර්තමානයේ භාවිතා කරන ජල මාර්ගයක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉවත් කිරීමට සිදු වේ.

**8.2.2 ශාක හා සත්වයින්ට සිදුවිය හැකි පාරසරික හා ජීව විද්‍යාත්මක බලපෑම**

ආපදා අවම කිරීමේ කටයුතු සඳහා නායයෑමට ලක්වූ බෑවුමේ ශීර්ෂය මත ඇති මිශ්‍ර වෘක්ෂලතා පටියක් ඉවත් කිරීමට සිදුවනු ඇත. කෙසේ වෙතත්, බොහෝ ව්‍යාපෘති ක්‍රියාකාරකම් දැනටමත් අස්ථායි හෝ බාධාකාරී බෑවුම් අංශ මත සිදු වනු ඇති බැවින් මෙම භෞමික පරිසර පද්ධති මත ඇති වන බලපෑම් එම ස්ථානයට පමණක් සීමා වනු ඇත.

**8.2.3 ප්‍රදේශයේ ජලවහන රටාවට සිදුවිය හැකි බලපෑම**

බෑවුමෙහි ජලාපවහනය වැඩිදියුණු කිරීම මගින් ආපදා තත්වය අවම කිරීමකට ලක් කෙරේ. මේ නිසා භූගත ජලය මට්ටම  අඩු වී දැනට ක්‍රියාකාරී උල්පත් වියලී යාමේ අවදානම පවතී. ඉහළ බෑවුමේ ජල භාවිතයක් නොමැති බැවින් ජල භාවිතය මත කිසිදු බලපෑමක් නොමැත. වර්ෂා කාලවලදී කාණු පද්ධතියෙහි හි අධික ජල ප්‍රවාහයන් ඇති විය හැක. කෙසේ වෙතත් බලපෑම් බොහෝ දුරට බෑවුමේ මෙම කොටස දක්වා සීමා වී ඇත.

**8.2.4 පාංශු ඛාදනයේ බලපෑම සහ ගංගා පතුල වෙනස්වීම්**

ආපදා අවම කිරීමට ලක්වන බෑවුම් ප්‍රදේශය බෑවුම් කැණීම්වල දී සහ ඉඩම් එළි කිරීමේදී  හිස් මතුපිට නිරාවරණය වීම හේතුවෙන්  වැසි සමයේදී ඛාදනයට ලක් විය හැකිය. බෑවුමේ විශාල ප්‍රදේශයක් කැණීම් කළ විට ඉහල රොන්මඩ ප්‍රමාණයක්  රැගෙන යන ධාරාවන් නිර්මාණය වේ. එබැවින්, මෙම ස්ථානයේ බෑවුම ඛාදනයට සුවිශේෂී බලපෑමක් ඇති වේ. කෙසේ වෙතත්, මෙම ස්ථානයෙන් 500 ක් පමණ දුරින් දිවෙන ස්වභාවික ගංගාවකි. මෙම ප්‍රදේශයෙන්  සෘජු ලෙස පෝෂණය වන ක්‍රියාකාරී ජලධාරා නොමැති හෙයින් ගංගා පත්ල ඛාදනයක් සිදුවීමට තරම් හැකියාවක් නොමැත.

**8.2.5 ඉදිකිරීම් කටයුතු නිසා සිදුවන ජල දූෂණය මගින් ඇතිවිය හැකි බලපෑම්**

බෑවුම් සකස් කිරීම / බෑවුම ප්‍රතිසංස්කරණය කිරීමේදී පවත්නා ජල මාර්ගවල පහල ප්‍රදේශ වල  රොන්මඩ තැන්පත් වීම සහ අවසාදිත ද්‍රව්‍ය අපේක්ෂා කළ හැකිය. යන්ත්‍රෝපකරණ වලින් තෙල් හා වෙනත් හානිකර ද්‍රව්‍ය / දූෂක නාශක බැහැර කිරීම, තාවකාලික ගබඩා ටැංකි වලින් වන කාන්දුවීම් , ඝණ අපද්‍රව්‍ය සහ ජලාපවහන බැහැරකිරීම / දහනය කිරීම මගින් ඇළ දොළ වල ජලයේ ගුණාත්මකභාවයට අහිතකර බලපෑම් ඇතිවීය හැකිය. හිතාමතා හෝ අපරීක්ෂාකාරීව ඉදිකරණ ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය (සිමෙන්ති/ පාංශු ශක්තිමත් කිරීම සඳහා භාවිතා කරන වෙනත් දියර බදාම) මතුපිට ජලය හා මිශ්‍ර වීමෙන් තාවකාලිකව ජලයේ තත්වයට හානි වන අතරම, පහළ ජලධාර වලට අනවශය  ද්‍රව්‍යයන් එකතු වේ. අසල ගංගා,ඇල දොල නොමැති වීම  නිසා ඉවුරු ඛාදනය, ගංගා සහ ඇල දොල වල පත්ල සෝදායාම වැනි බලපෑම් ඇති නොකරයි.

**8.2.6 ඉදිකිරීම් කාලසීමාවේදී අක්‍රමවත් (එළිමහන් ස්ථාන) වැසිකිලි භාවිතය නිසා ජලය මගින් සිදුවිය හැකි ලෙඩරෝග බෝවීම**

ශ්‍රම බලකාය විසින් විවෘත ස්ථාන වල මළපහ කිරීමේ සම්භාවිතාවයක් ඇති අතර එමගින් ජලය මගින් ආසාදනය විය හැකි රෝග පැතිරීමේ හැකියාවක් තිබේ

**8.2.7** **පහල ගංගා ප්‍රදේශයේ ජලය පරිභණය කරන්නන් හට ඇතිවිය හැකි බලපෑම්**

ඉහල බැවුම් ප්‍රදේශය තුළ ආපදා අවම කිරීමේ කටයුතු හේතුවෙන් උල්පත් හා ජල ප්‍රභවයන් වියළීමේ අවදානමක් ඇත. ඉහල බැවුම් ප්‍රදේශයේ ඇති උල්පත් වල ජලය සෘජු වශයෙන් භාවිත නොකරන අතර බලපෑමට ලක් වූ බෑවුම් කොටස හරහා ගමන් කරන ජල ධාරාවන්හි ජල පෝෂක ස්ථානය ව්‍යාපෘති ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇත.

**8.2.8** **ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු**

ඝන අපද්‍රවය ඉදිකිරීම් කාලය තුළ නිසි පරිදි බැහැර කිරීමේ යාන්ත්‍රණයක් නොමැතිව ක්ෂණිකව බැහැර කිරීම තුළින් ජලය සහ පස දූෂනය වීමෙන් විවිධ පාරිසරික බලපෑම් ඇති විය හැකිය. ඉදිකිරීම් කාලය තුළ නිසි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් භාවිතා නොකළ හොත් මෙම බලපෑම සුවිශේෂී වනු ඇත.

**8.2.9** **වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම්**

වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් වනුයේ: ඉඩම් එළි කිරීම, ඩීසල් එන්ජින් ක්‍රියා කරවීම, කැනීම්, ගිනි තැබීම සහ ඉදිකිරීම් ද්‍රවය සහිත අපද්‍රවය බැහැර කිරීම, ඉදිකිරීම් අපද්‍රවය සහ විෂ සහිත ද්‍රව්‍ය සමඟ (පිපිරුම් රසායන ද්‍රවය) වැඩ කිරීම. ඉදිකිරීම අතරතුරදී, කොන්ක්‍රීට් , සිමෙන්ති, ලී, ගල්, සහ සිලිකා වැනි ද්‍රව්‍ය මගින් විශාල ලෙස දූවිලි ඇති කරයි. තවද, වායු දූෂණය මගින් මාර්ගයේ ගමන් කරන පදිකයින් සහ මගීන් කෙරෙහි ද බලපෑම් ඇති විය හැකිය. මාර්ගයට අභිමුඛව නිවාස පිහිටා ඇත. එබැවින් වායු දූෂණය නිවැසියන්ට ද බලපානු ඇත.

**8.2.10** **ඉදිකිරීම් වලදී ඇතිවන ශබ්දය දූෂණය, කම්පන, පිපිරීම් වැනි බලපෑම්, හේතුවෙන් ගොඩනැගිලි වලට හා යටිතල පහසුකම් වලට ඇති විය හැකි හානි**

කඩා වැටෙමින් පවතින පාෂාණ කොටස් කිහිපයක් ඉවත් කිරීම සඳහා පිපිරවීම් භාවිතා කරනු ලබන අතර ඝන පාෂාණ කොටස් ඉවත් කිරීම සඳහා කැණීම් ද , තිරස් කාණු සෑදීම සහ පාෂාණ කොටස් තද කිරීම වැනි ක්‍රියා මගින් විශාල ශබ්දයන් හා භූ කම්පන ඇති විය හැකිය.
ඉහත සඳහන් ඉදිකිරීම් කටයුතු වලට අමතරව යන්ත්‍රෝපකරණ චලනය කිරීම හා පැටවීම සහ බෑම වැනි දැඩි ඝෝෂාකාරී ක්‍රියාකාරිත්වයන් හේතුවෙන් මාර්ගයේ ගමන් කරන මගීන් සහ අවදානම් නිවාස වල සිටින පුද්ගලයන් දැඩි ශබ්දයන්ට නිරාවරණය වේ.

**8.2.11** **වැඩබිමේ සේවකයන් හා අවට ප්‍රදේශවාසීන් අතර ඇතිවියහැකි නොසන්සුන් තත්වයන්**

ඉදිකිරීම් ස්ථානයේ සේවකයන් සහ ගම්වැසියන් අතර ආරවුල් ඇති විය හැකිය.

**8.2.12** **සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්**

කඳවුර තුළ ඇති ඝණ අපද්‍රව්‍ය හා කසල ඉවත් කිරීම ක්‍රමවත්ව නොකිරීමෙන් අවට ප්‍රජාව පීඩාවට පත් වනු ඇත.

**8.2.13** **ඉදිකිරීම් අතර තුර ප්‍රදේශවාසීන් වැඩ බිමට ඇතුළු වීම හේතුවෙන් ඔවුන්ට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් තත්වයන්**

ආපදා අවම කිරීමේ වැඩබිම වැටී ඇත්තේ මාර්ගයේ දිගට වැටී ඇති බෑවුම් තීරයක් මතය. එමෙන්ම විදීම්, බෝර දැමීම සහ කැණීම් යන්ත්‍ර වැනි අධික අවදානමක් සහිත යන්ත්‍රෝපකරණ මෙම වැඩබිමෙහි තිබිය හැකි ය. මෙම වටපිටාව තුළ පුහුණු ශ්‍රම බලකාය පමණක් සුරක්ෂිතව කටයුතු කරනු ලබන අතර අනවසර පුද්ගලයින් මෙම වැඩබිමට පිවිසෙන්නේ නම්, බර යන්ත්‍රෝපකරණ මගින් සිදුවිය හැකි හදිසි අනතුරුවලට ලක්වීමේ අවදානම තිබිය හැකිය.

**8.2.14 පුපුරන ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය**

පාෂාණ කොටස් පුපුරා හැරිම  අපේක්ෂා කරන අවස්ථාවන්හි පුපුරණ ද්‍රව්‍ය භාවිතා කළ හැකි නමුත් අනාරක්ෂිත භාවිතය නිසා මෙය අවදානමකට ලක් විය හැක. මෙම මෙහෙයුම් අස්ථාවර බෑවුම් මත සිදු කරන බැවින් පුපුරණ ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කිරීමේදී  සහ පාෂාණ කැබලි හේතුවෙන් සිදුවන අනතුරු සඳහා සුවිශේෂී අවදානමක් අවශ්‍ය වේ.

**8.2.15 ඉදිකිරීම් කටයුතු අතරතුර සිදුවන මාර්ග තදබදය සහ පදිකයින්ගේ ආරක්ෂාව**

ඉදි කිරීම් අදියර තුළදී ගමන් කරන යාන්ත්‍රෝපකරණ, බර පටවාගෙන යන වාහන, ට්‍රක් රථ ආදීයෙන් බොහෝ විට  මාර්ගය අවහිර වනු  ලැබේ. බොහෝ දුරට අවදානම අවම කිරීමේ කටයුතු වලදී  බෑවුම්වල ඇති කුඩා ඉඩ ප්‍රමාණයන්හි බර යන්ත්‍රෝපකරණ, ට්‍රක් රථ හා බර පටවාගෙන යන වාහන ගමන් කිරීම හේතුවෙන්  මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට සහ පදිකයන්ට බාධා ඇතිවිය හැකි අතර ඔවුන්ගේ ජීවිතයටද දැඩි අවදානමක් ඇත. කැණීම් සහ පාෂාණ ඉවත් කිරීමේදී ලිහිල් වී ඇති පාෂාණ මාර්ගය මතට වැටීමෙන් මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට අවදානම් තත්වයක්  ඇති කරනු ඇත.

**8.2.16 ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව**

ඉදිකිරීම් කටයුතු වලදී  බර යන්ත්‍රෝපකරණ සීමිත වැඩ අවකාශයක් තුළ භාවිතා කරනු ලැබේ. එබැවින් වාහන වලින් සිදුවන අනතුරු හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ මගින් සිදුවන අනතුරු අවදානම ඉතා ඉහළ ය. තවදුරටත්, කලින් කලට සිදුවන සුන්බුන් වැටීම්  හා ගල් කැබලි කැඩී යාමත් සමග වැඩ බිම අස්ථායී වී ඇත. බෑවුම වෙනස්  කිරීමේ අදියරේදී මෙම අවදානම තවත් වැඩි විය හැක. තව ද, කම්කරුවන්ට මෙම බෑවුම මතට  නැගීම සඳහා පලංචි මත වැඩ කිරීමට සිදු විය හැකිය. කම්කරුවන් සිදුවිය හැකි සෑම අනතුරක් සඳහාම අවදානමට ලක්විය හැකි අතර එබැවින් සුළු කම්කරුවෙකු පවා මෙම වැඩබිම සඳහා ඉතා වැදගත් ය. ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු   අඩු වයස් සහිත කම්කරුවන් (ළමයින්) වැඩ කිරීමට යෙදෙවිය හැකි අතර එමගින් බරපතල අනතුරු හා තුවාල සිදුවීය හැක.

**9. මහජන උපදේශයනය - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්**

ක්ෂේත්‍ර චාරිකාවක් අතරතුරදී අධි අවදානම් සහිත නිවසක පදිංචිකරුවකු වන ඒ.ඒ.සී. අබේසිංහ මහතා හට උපදෙස් ලබා දී ඇති අතර  අවදානම් සහිත නිවාසවල නිවැසියන් එම නිවෙස් වලින් ඉවත් කර නොමැත. මෙම පදිංචිකරුවන් අධික වැසි අවස්ථාවලදී බෑවුම් අස්ථායීතාවයන් පිලිබඳ දැඩි විමසිල්ලකින් සිටින අතර උල්පත් ජලය මඩ සහිත වර්ණයෙන් පෙනෙන විට, ඉහල බෑවුම් ප්‍රදේශය තුළ ඇති ආතති  පිපිරීම් සහ ඉහල බෑවුම් ප්‍රදේශයේ  ගස් ඇල වීමක් දක්නට ලැබුන විට ඔවුන් එම ස්ථානවලින් ඉවත් වේ .

**9.1පාර්ශවකරුවන් සමග පැවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකගතාවයන් හා නිර්දේශයන් (යොමුව: ඇමුණුම III)**

**10.විශේෂිත පාරසරික හා සමාජීය බලපෑම්: ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විශේෂිත ක්‍රියාමාර්ග හෝ මැදිහත් වීම් අවශ්‍ය වන සමාජ, පාරිසරික බලපෑම් හෝ අවදානම් ඇතිවන අංශයන්**

**10.1 ජලය සහ තෙත් බිම් සඳහා ඇති බලපෑම් (ඇල මාර්ග, ගංගා හා අනෙකුත් ජල ධරයන් විශේෂයෙන් ඉදිකිරීම් ස්ථානයෙන් පහල ගංගා ප්‍රදේශ අපවිත්‍ර වීම් හා එහි තත්වය වෙනස්වීම නිසා ඇතිවන ගැටළු). නායයාම් ස්ථානය ඉදිකිරීම / පිළිසකර කිරීම තුලින් ඇතිවන දිගුකාලීන බලපෑම් සහ විය හැකි  බලපෑම්**

ආසන්නයේ ජල මාර්ග නොමැති බැවින් එහි බලපෑම අවම මට්ටමක පවතී.

**10.2 බාදන ක්‍රියාවලිය ආශ්‍රිත බලපෑම් හා ගංගා පතුලේ සිදුවන වෙනස්වීම්**

බෑවුම ආසන්නයේ ජල මාර්ග නොමැති බැවින් පාරිසරික ගලායාම, ඇළ දොල ඉවුරු / පත්ල සහ ජලජ පරිසර පද්ධති මත ඇතිවන බලපෑම ස්ථානීය වශයෙන් වැදගත් නොවේ. මෙම ප්‍රදේශයෙන්  ඍජු ලෙස පෝෂණය වන ක්‍රියාකාරී ජලධාරා නොමැති හෙයින් පහල ප්‍රදේශයේ  ගංගා පත්ල ඛාදනය සිදුවීමට හැකියාවක් නොමැත.

**10.3 ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා වන බලපෑම් (විශේෂයෙන් මාර්ග හා දුම්රිය මාර්ග තාවකාලික අවහිර වීම, රථවාහන තදබදය පිළිබඳ අවදානම)**

සම්පූර්ණ ලෙස හෝ අර්ධ ලෙස මාර්ගය වසා දැමීම නිසා ඇතිවන මාර්ග තදබදය හේතුවෙන් වාහන ගමනාගමනයට බාධා ඇති විය හැකිය. මෙය පදිකයින්ට සහ මගීන්ට හිරිහැරයක් වනු ඇත. අවම කිරීමේ කටයුතු හේතුවෙන් මාර්ගයේ මීටර් 150 ක් පමණ පීඩාවට පත් වේ. මෙම මාර්ගය දිගට එකිනෙකට සමගාමීවම යන්ත්‍රෝපකරණ කිහිපයක් ක්‍රියාත්මක වේ. අනෙකුත් නායයෑම් අවදානම් අවම කිරීමේ ස්ථානවලට වඩා භාවිතා කරනු ලබන ද්‍රව්‍ය පරිමාව, අපද්‍රව්‍ය උත්පාදනය, ඉදි කිරීම් වාහන වල ක්‍රියාකාරීත්වය ආදිය සැලකිය යුතු ලෙස ඉහළ ය. අධික වර්ෂාව අතරතුරදී ඉහළ බෑවුමේ අස්ථාවර අවදානම හේතුවෙන් මුළු ප්‍රදේශයම අනාරක්ෂිත බවට පත්වනු ඇත. තවද වැඩබිම ආසන්නයේ වංගුවක් පවතින අතර එමනිසා වාහන වැඩබිමට නොපෙනේ. එබැවින් මගීන් සහ ශ්‍රම බලකාය මත මාර්ග තදබදය, රිය අනතුරු පිළිබඳ අවදානම, බෑවුම් අස්ථාවර වීමෙන් ඇති වන අවදානම බොහෝ සෙයින් බලපෑම් ඇති කරන බව සැලකිය යුතුය.

**10.4 පොදු සේවා සැපයීමේදී පහල ප්‍රදේශයට සිදුවන බලපෑම (ජල සැපයුම, අපද්‍රව්‍ය ඉවත් කිරීම, විදුලිය සැපයීම, ආදිය)**

නායයෑමට ලක්වූ බෑවුමේ ජල සැපයුම් නල අතුරා ඇත. මෙම සැපයුම් මාර්ග වල ජලය ගුරුත්වාකර්ෂණය යටතේ ගමන් කරමින් මාර්ගයේ දෙපස ඇති නිවාස වලට යොමු කෙරේ. පිරිසිදු කිරීම, සේදීම, ස්නානය කිරීම සහ පානය කිරීම වැනි විවිධ අරමුණු සඳහා මිනිසුන් විසින් මෙම ජලය භාවිතා කරනු ලැබේ. අවදානම අවම කිරීමේ කටයුතු සැපයුම් මාර්ග වලට හානි පැමිණ විය හැකි අතර ජල පරිහරණය කරන්නන් සඳහා ගැටළු ඇති වේ.

ව්‍යාපෘතිය හේතුවෙන් විදුලි රැහැන් හෝ විදුලි සංදේශ රැහැන් බලපෑමට ලක් නොවනු ඇත.

**10.5 නාය ස්ථානයට යාබදව හෝ ආසන්නයේ ඇති ඉහල අවදානමක් සහිත හෝ මධ්‍ය පරිමාණ අවදානමක ජීවත් වන ගෘහ ඒකක (ඉහළ බෑවුම, පහළ බෑවුම, පහළ ගංගා ප්‍රදේශය යන ආදිය)**

මෙම ඉදිකිරීම හේතුවෙන් මාර්ගය අභිමුව පිහිටා ඇති නිවාස වල ඉරිතැලීම්, ශබ්දය සහ කම්පන බලපෑම් මෙන්ම මහජන ආරක්ෂාව පිළිබඳ ඉහළ අවදානමක් පවතී.

**10.6 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන**

වැඩ බිමට යාබදව ව්‍යාපාර සඳහා යොදාගත් ප්‍රදේශ, විශේෂ කෘෂිකාර්මික පිළිවෙත් හෝ වෙනත් කිසිදු විශේෂ කටයුත්තක් නොමැති නිසා ඒ සඳහා විශේෂිත බලපෑමක් නොමැත.

**10.7 ස්ථානයට අසලින්ම පිහිටි ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙක් ස්ථාන**

වැඩ බිම ආසන්නයෙන්ම කෘෂිකාර්මික භාවිතයන් හෝ වෙනත් කිසිවක් නොමැති බැවින් කෘෂිකාර්මික භාවිතයන්ට සැලකිය යුතු බලපෑමක් නැත.

**10.8 වැඩ බිම තුලට සාමාන්‍ය පුද්ගලයින් ඇතුළු වීමේ හෝ එම ප්‍රදේශය හරහා ගමන් කිරීමේ අවශතාවය**

වෙනත් අරමුණු සඳහා පුද්ගලයින් හට වැඩබිමට ඇතුළු වීමට විශේෂ අවශ්‍යතාවක් නොමැත. කෙසේ වෙතත්, අරමුණක් සහිතව හෝ නොමැතිව පුද්ගලයින් අනවසරයෙන් පිවිසිය හැකි අතර ඔවුන් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම, වාහන, විදුලිය හා පුපුරණ ද්‍රව්‍ය හේතුවෙන් අවදානමට ලක් විය හැකිය.

**10.9 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබධ ගැටළු සඳහා වන ප්‍රමුකත්වය: කොන්ත්‍රාත්කරු වන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබද කරුණු**

මෙම වැඩ බිමට අදාළ වන සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු ගත් කල ඕනෑම නායයාම අවම කිරීමේ ස්ථානයකටම පොදු වේ. ESMF හීදී එවන් පොදු E & HS ගැටළු සාකච්ඡා කර ඇත. ඉදිකිරීම් වැඩ බිමෙහි සේවක ආරක්ෂක අවශ්‍යතාවයන් ලංසු පත්‍රිකාවේ 2003 5: ආරක්ෂක උපකරණ සහ ඇඳුම් යන යටතේ

වඩාත් විස්තරාත්මකය. මීට අමතරව, අවදානමට ලක්වන සිරස් අස්ථායී බෑවුම් සහිත ප්‍රදේශය, සාමාන්‍ය මාර්ගයක නායයාම් අවම කිරීමේ ස්ථානයකට සාපේක්ෂව වඩා වැඩි ය. එමෙන්ම ඉදිකිරීම් කටයුතු වල නිරත වන ශ්‍රමිකයන් සංඛ්‍යාව සාමාන්‍ය මට්ටමට වඩා වැඩි වනු ඇත. එකවර යන්ත්‍ර ගණනාවක් ක්‍රියාත්මක වන අතර එබැවින් සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ මතු වන ගැටළු මෙම කොටසෙහි ඉතා වැදගත් වේ.

### 10.10 ළමා ශ්‍රම සහ බලහත්කාරී ලෙස ශ්‍රම ලබා ගැනීම

ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීමේ චක්‍රලේඛයේ 2003.3 වගන්තියට අනුව වැඩ කරන තත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත.

## 11. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ විරෝධතා නොමැති බව

### 11.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමැතිය

දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කළ යුතු අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට පළාතේ මහ ඇමතිවරයා හා පාර්ශ්වකරුවන්ගේ ආයතන ද සහභාගී වනු ඇත. PMU නිලධාරියා මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලබන අතර, ව්‍යාපෘති තොරතුරු සහ පාරිසරික හා සමාජයීය විවිධ ගැටලු නිරාවරණය කිරීම හා ගැටළු සාකච්ඡා කරනු ඇත. මෙම රැස්වීමෙහි නිර්දේශය ESMP ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බලනු ඇත.

ii. සැලසුම් කමිටුවේ අනුමැතිය

මෙම ව්‍යාපෘතිය සඳහා PMU විසින් රුවන්වැල්ල ප්‍රදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

### 11.2 තෝරාගත් නායයෑම් සිදුවූ ස්ථානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වතු සමාගම් ඉඩම් හිමියන්ගෙන් අනුමැතිය ලබා ගැනීම

ව්‍යාපෘතියෙහි කාර්යයන්ගෙන් කොටසක් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග වෙන් කිරීමක් සිදුකර ඇති ප්‍රදේශයක සිදු කරනු බැවින් අදාළ නියෝජිතායතනය වනුයේ මාර්ග සංවර්ධන අධිකාරියයි. ඉඩම් ගොඩකිරීමට, ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට, ද්‍රව්‍ය ඉවත් කිරීමට (ගස්, පස, පාෂාණ හා ගල් බිම්), ඉදි කිරීම් ව්‍යුහයන් සහ මෙහෙයුම් හා නඩත්තු කටයුතු දිගටම කරගෙන යාමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ මාර්ග සංවර්ධන අධිකාරිය අතර අවශ්‍ය ගිවිසුම් ඇති කරගනු ලබනු ඇත.

### 11.3 මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා ගැනීම

ව්‍යාපෘති ප්‍රදේශය පරිසර සංවේදී ප්‍රදේශ වල පිහිටා ඇති බැවින් දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය අවශ්‍ය වේ. ක්‍රියාපටිපාටිය සඳහා ඇමුණුම IV බලන්න.

### 11.4 අනෙකුත් අනුමැතීන්

i. භූමි, පාෂාණ හා ඛනිජමය සුන්බුන් ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය.
ii. ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අනුමැතිය - භූ විද්‍යා හා පතල් කාර්යාංශය මගින් (අවශ්‍ය වන්නේ නම් පමණි).
iii. කසළ බැහැර කිරීම සහ පැළැටි ඉවත් කිරීම සඳහා රුවන්වැල්ල ප්‍රදේශීය සභාව වෙතින් අනුමැතිය ලබා ගත යුතුය.

iv. පාෂාණ පිපිරවීමට අවශ්‍ය නම් වැඩබිම සඳහා අනුමැතිය ප්‍රදේශීය ලේකම් හරහා ආරක්ෂක අමාත්‍යාංශයේ දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබා ගත යුතුය.

v. වැඩ බිමෙහි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය බල සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රදේශීය කාර්යාලයෙන් අනුමැතිය ලබා ගත යුතුය.

## 11.5 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබා ගැනීම / නෛතික බැදීම/ විරුද්ධත්වයක් නොමැති වීම

මෙහි රබර් ඉඩෙම් අයිතිකරු ප්‍රියංග ප්‍රියදර්ශනී පෙරේරා මහත්මිය වන අතර ව්‍යුහයන් ඉවත් කිරීමට, භූමියට පිවිසීමට, ඉදිකිරීම් වැඩ සහ දිගුකාලීන නඩත්තු කටයුතු වල නිරත වීමට කිසිදු බාධාවක් නොකරන බවට ඉඩම් හිමිකරුවන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නිත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමක් අත්සන් කිරීම කරනු ලැබේ.

යෝජිත අවදානම් අවම කිරීමේ ප්‍රදේශය හරහා ජල සැපයුම් මාර්ග ඇත. ඉදි කිරීම් කටයුතු මගින් මෙම සැපයුම් මාර්ග බලපෑමට ලක් වනු ඇත. මෙය අවදානමට ලක්වූ පක්ෂ වෙත දැනුම් දෙනු ලැබේ. ව්‍යාපෘති පිරිවැය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා නැවත ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත.

අනුමත කිරීම සඳහා නියමිත අනුමාන කාල සටහන 1 වගුවේ දක්වා ඇත.

වගුව 1: අනුමැතීන් ලබා ගැනීම සඳහා නියමිත කාල නියමය

| අනුමැතිය | පළමු මාසය | | | | දෙවන මාසය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සති 1 | සති 2 | සති 3 | සති 4 | සති 1 | සති 2 | සති 3 | සති 4 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**<br>***දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය***<br>*අයදුම්පත් ඉදිරිපත් කිරීම*<br>*ව්‍යාපෘති සාකච්ඡාව*<br>*අදහස්වලට ප්‍රතිචාර දැක්වීම*<br>*අනුමත කිරීම* | | | | | | | | |
| ***සැලසුම් කමිටුවේ අනුමැතිය***<br>*අයදුම්පත් ඉදිරිපත් කිරීම*<br>*ව්‍යාපෘති සාකච්ඡාව*<br>*අදහස්වලට ප්‍රතිචාර දැක්වීම*<br>*අනුමත කිරීම* | | | | | | | | |
| ***රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය***<br>*අයදුම්පත් ඉදිරිපත් කිරීම*<br>*අදහස්වලට ප්‍රතිචාර දැක්වීම*<br>*අනුමත කිරීම* | | | | | | | | |
| **වෙනත් අනුමැතීන්**<br>භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුමැතිය<br>ආරක්ෂක අමාත්‍යාංශය ( අවශ්‍යතාව මත තීරණය වේ ) | | | | | | | | |
| අනුමැතිය / පෞද්ගලික ඉඩම් දැන් අයිතිකරුවන්ගේ විරෝධයක් නොමැත | | | | | | | | |

## 12.පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP)

විශේෂයෙන් අංශ 8 සහ 10 හි හඳුනාගත හැකි බලපෑම් හා අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා මෙය ESMP හි විශේෂිත නිර්දේශ හා අවශ්‍යතාවන් තුල ඇතුලත් වනු ඇත.

### 12.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

මෙම භූමියේ නිවාස නැවත ස්ථාපනය කිරීම සිදු නොකෙරේ.

### 12.2 මහජනතාව ඉවත් කිරීම

ඉදිකිරීමේ අදියරේදී අධි අවදානම් සහිත නිවෙස් වල සිටින නිවැසියන් හට ජීවිත තර්ජන එල්ල විය හැකිය. ඉදි කිරීමේ අදියරේදී නායයාම නැවත සිදු විය හැකි අතර, අවදානම අවම කර ගැනීමේ කටයුතු මගින් බෑවුම අස්ථාවර වීමේ අවදානම ඉහල යාමට බෙහෙවින් බලපායි, එමනිසා ව්‍යාපෘති කාර්යයන් සමග ඇති වන අවදානම සැලකිල්ලට ගත යුතු වේ. පාරිසරික හා සමාජ කළමනාකරණ කණ්ඩායම විසින් බෑවුමට සෘජුව පහලින් පිහිටි නිවාස තුනක් අධි අවදානම් ලෙස හඳුනාගෙන තිබේ. ඉදිකිරීම් අධියර තුළ මෙම නිවාසවලට පවතින බෑවුම අස්ථාවර වීමේ අවදානම තක්සේරු කිරීමට නිර්දේශ කරනු ලැබේ. එවැනි තත්වයක් පවතින්නේ නම්, සුන්බුන් අවදානම හෝ විශාල ගල් ඇද වැටීමේ අවදානම පිළිබඳව සලකා බැලිය යුතුය. එවැනි ආපදා අවම කිරීමේ පියවරයන් ප්‍රායෝගික නොවන්නේ නම් තාවකාලිකව පුද්ගලයන් නිවස් වලින් ඉවත් කරන ලෙස ප්‍රබලව නිර්දේශ කරනු ලැබේ. රජයේ නැවත පදිංචි කිරීමේ පැකේජය යටතේ මෙම කුටුම්භ සලකා නොලබන බැවින් ඔවුන්ට ප්‍රදේශයෙන් නිවසක් කුලියට ගැනීම සඳහා සුදුසු වන්දි ගෙවීමක් සලකා බැලීම සාධාරණ ය.

### 12.3 හානි ව්‍යුහයන් සහ යටිතල පහසුකම් ඉවත් කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය

ඉවත් කිරීමට අවශ්‍ය වන හානි වු ව්‍යුහයන් නොමැත.

### 12.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපල / භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ඉල්ලා සිටීම

ඉහත සඳහන් විවිධ ව්‍යාපෘති ක්‍රියාවන්ගෙන් උත්පාදනය වන ඉහල කම්පන හේතුවෙන් පහල බෑවුමේ සහ ප්‍රතිවිරුද්ධ දිශාවේ පිහිටි නිවාස මත ඉරිතැලීම් ඇති විය හැකිය. පරිසර අධිකාරියෙන් නිර්ණය කරන ලද සීමාව තුල කටයුතු පවත්වාගෙන යාම සඳහා භූ කම්පනය අවම කිරීම සහ ඒවා පාලනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අනිවාර්ය වේ.ව්‍යාපෘති හේතුවෙන් ඉරිතැලීම් සිදුවන්නේ නම්, එයට වන්දි ගෙවිය යුතු අතර කොන්ත්‍රාත්කරු විසින් වියදම දරා ගත යුතුය.

### 12.5 පහත දැක්වෙන ක්ෂේත්‍ර සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබාදීම

පදිංචිකරුවන් සහ ශ්‍රම බලකාය සඳහා නායයාමේ අවදානම පිළිබඳ විශේෂ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.
ඉදිකිරීම් අදියර තුළදී කොන්ත්‍රාත්කරු වන්ගේ ශ්‍රම බලකාය සඳහා සෞඛ්‍ය හා ආරක්ෂණ අවශ්‍යතා සඳහා විශේෂ අධ්‍යාපන වැඩසටහන් පැවැත්විය යුතුය.

### 12.6 සැලසුම් මත පදනම් වූ පරිසරික / සමාජ කළමනාකරණ ක්‍රමවේදයන්

පරිසර හිතකාමී හා සමාජීය වශයෙන් සැලකිය යුතු සැලසුම්කරණය සලකා බැලීමෙන් පසු ආපදාව අවම කිරීමේ ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමේදී පහත දක්වා ඇති කරුණු සලකා බැලිය යුතු ය.

වගුව 2: සැලසුම් අදියරයේදී පාරිසරික හා සමාජ තත්ව සලකා බැලීම්

| සැලසුම් අංගය | මෙම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා සලකා බැලීම සඳහා නිර්දේශිත මට්ටම |
|---|---|
| **i . ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ත ලෙස සැලසුම් කරණය**<br>ජනාවාස ඉවත් කිරීම සහ ශාක විශේෂයන් ඉවත් කිරීම අවම කිරීම සඳහා වන ව්‍යාපෘති විශේෂිත සැලසුම් සැලකිල්ලට ගත යුතුය. වැදගත් ශාක විශේෂ වෘක්ෂලතා ආවරණය සමග බැඳී ඇත්නම්, ශාක සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | අඩු / සීමිත |
| **ii .වාසස්ථාන සම්බන්ධතා සහ සත්ව මංපෙත්**<br>ස්ථිර ඉදිකිරීම් සඳහා හෝ ව්‍යාපෘතියට පිවිසීමට හෝ ගැඹුරු කානු පද්ධති ආදිය සඳහා හෝ විශාල වශයෙන් වනාන්තර කොටස් ඉවත් කිරීමට සිදුවන්නේ නම් සැලසුම් තුළ සත්ව වාසස්ථාන අතර සම්බන්ධතා නොබිඳෙන ලෙස සත්ව මංපෙත් වෘක්ශලතා තීරු ආදිය ඇතුළත් විය යුතුය. | වැදගත් සත්ව විශේෂයන් සඳහා අවශ්‍ය වන්නේ නම් පමණි |
| iii. **ජල සම්පත සංරක්ෂණය**<br>මෙයට පෘෂ්ඨය හා උප පෘෂ්ඨය යන දෙකෙහිම අඩංගු ජලය ලබා ගැනීම අඩංගුවේ. ලබාගත් ජලය සාපේක්ෂ වශයෙන් හොඳ තත්වයේ පවතී නම් හොඳින් සැලසුම් කර මෙම ජලය ශාක වලට සහ අසල්වැසි ප්‍රජාවගේ පානීය සහ අනෙකුත් ජල අවශ්‍යතා සඳහා ලබා දිය යුතුය. | ඉතා ඉහල |
| **iv. ජල සැපයුම අවහිර වීම**<br>ආපදා අවම කිරීමේ කටයුතු නිසා ස්වභාවික ජල උල්පත් වියලී යාමත් සමඟ ජල ප්‍රභවයට ඉහල බලපෑමක් ඇතිවිය හැකිය .<br>(තාවකාලික / ස්ථිර)<br>කෙසේ වෙතත් ඉහල බෑවුමෙහි ව්‍යාපෘති බලපෑම් ප්‍රදේශයේ ජලය ලබා ගන්නා ලක්ෂ නොමැත. | සීමිත |
| **v.ස්වභාව සෞන්දර්යාත්මකව ගැලපෙන සැලසුම් සලකා බැලීම**<br>සෞන්දර්යාත්මක සංවේදී පරිසර නිර්මාණයේදී ස්වභාවික පරිසරය හා සංකලණය වන එමෙන්ම දෘශ්‍ය අවම වන ලෙස ව්‍යුහයන් සැලසුම් කිරීමට සැලකිලිමත් විය යුතුය. ඒ සඳහා සුදුසු ස්ථායී ව්‍යුහයන් නිර්මාණය කිරීම සඳහා භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සේවය වැදගත් වේ. | ඉතා ඉහල |
| **vi.හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>පරිසර හිතකාමි සංවේදී වාසස්ථානවල ආපදා අවම කිරීම් බොහොමයක් සිදු කරනු ලබන බැවින්, පරිසර හිතකාමී හරිත සැලසුම් ගැන සැලකිලිමත් විම වඩාත් උචිතය. උදාහරණයක් ලෙස: ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම, පරිසරයේ විවිධත්වය පවත්වා ගැනීමට විශේෂ ශාක සංයෝජනයන් යොදා ගැනීම. ආක්‍රමණශීලී ශාක විශේෂයන් යොදා නොගැනීම වැනි ක්‍රියාවන්ය.<br>බෑවුම සකස් කිරීමේදී වැඩ බිමෙහි ඉවත් කල යුතු විශාල පාෂාණ ඇත. මෙම පාෂාණ පුපුරවා හරිනු ඇත. මේවා ව්‍යාපෘතිය ඉදිකිරීමේදී අමුද්‍රව්‍ය වශයෙන් සලකා බැලිය හැකිය. | ඉහල |

| | |
|---|---|
| **vii.සේවකයින් / මගීන් සහ ප්‍රජා ආරක්ෂාව**<br>ඉදිකිරීම් අදියර තුළදී නායයෑම් සක්‍රීය වීම සිදු විය හැකි අතර කම්කරුවන්ට සහ මගීන්ට අන්තරාකාරී විය හැකිය. එබැවින් ගැටි , ආරක්ෂිත දැල් වැනි සැලසුම් කළ ආරක්ෂණ ක්‍රම සැලකිල්ලට ගත යුතුය. | ඉතා ඉහල |
| **viii.ඛාදනය පාලනය සඳහා වන ක්‍රියාමාර්ගයන්**<br><br>බෑවුමේ විශාල ප්‍රදේශයක පෘෂ්ඨීය ජල අපවහන කළමණාකරණය මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. අධික වැසි කාලවලදී ඛාදනයට තුඩුදිය හැකි ජල ගැලීම් ජනනය වීමේ හැකියාවක් පවතී. එබැවින් සැලසුම් කිරීමේදී අධික ජලධාරාවන් ස්වභාවික ජල මාර්ග වලට වේගයෙන් ගලායාම අවම කිරීම සඳහා බාධකයන් ප්‍රමාණවත් ලෙස යොදා ගැනීම සහ අවශ්‍ය ඛාදන පාලන ක්‍රම ආදියෙන් ඛාදනයට තුඩුදිය හැකි ප්‍රවාහ වලින් සිදුවන හානිය සලකා බැලිය යුතුය. | ඉතා ඉහල |
| **ix.අවම පසු නඩත්තු කිරීම් සහ මෙහෙයුම් සැළසුම් කිරීම**<br>අවම කිරීමේ කාර්යේදී ජලාපවහන කළමණාකරණය සඳහා ගුරුත්ව කාණු වැනි අක්‍රිය ශිල්ප ක්‍රම (අමතර ශක්ති ප්‍රබවයක් අවශ්‍ය නොවන)සලකා බැලිය යුතුය. කාණු ඇහිරී යාම වළක්වා ගැනීම සඳහා නිවැරදි පයිප්ප විෂ්කම්භය ,සිදුරු වල විෂ්කම්භ සහ ඇතිරීමේ ආනතිය නිවැරදිව සලකා බැලිය යුතුය. කානු ජලය ස්වාභාවික දහරාවන්ට එකතු කරවීමට අපේක්ෂා කරන්නේ නම්, ඛාදනයට ඔරොත්තු දෙන, රොන් මඩ රඳවා ගැනීමේ පද්ධති ආදී නොයෙක් නඩත්තු ව්‍යුහ සැලසුම් කළ යුතුය.<br><br>විශාල කාලපරිච්ඡේදයක් තුල දේශීය කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිතා කිරීමේදී විශේෂයෙන් විඛාදන වැලකීමේ තාක්ෂණික ක්‍රම සැලසුම් කළ යුතු අතර සියුම් රොන්මඩ උප නළ මාර්ග වලට කාන්දු වීම වැළැක්වීමට පියවර ගත යුතුය. | ඉතා ඉහල |

## 12.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම

### 12.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරු වන්ගේ අවශ්‍යතාවයන්, පාරිසරික හා සමාජ කළමනාකරණය ප්‍රමිතීන් වලට අනුකූල වීම

පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලු නායයාම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ කටයුතු වල ක්‍රියාකාරිත්වයට හේතු වේ. එබැවින් ඉදිකිරීමේදී වන බලපෑම අවම කිරීම කොන්ත්‍රාත්කරු ගේ යුතුකමකි. ඉදිකිරීම් අදියරේදී කොත්‍රාත්කරුවන්ගේ ලංසු පත්‍රිකාවේ ඇතුලත් කර ඇති පාරිසරික, සමාජ , සෞඛ්‍ය සහ ආරක්ෂණ (ES & HS) කළමනාකරණයට අනුකූලව කොත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය කෙසේ විය යුතුද යන්න පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සකස් කර ඇති අතර මෙම කොටස සඳහා අදාළ අංශවල ගුණාත්මක බව දැක්වෙන ප්‍රධාන කොටස් පහත දක්වා ඇත.( වගුව 3). විස්තර සඳහා, ESMP ඉදිකිරීම් කොත්‍රාත්කරුවන් සඳහා යොමු කළ යුතුය.
කොත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත යටතේ ESMP වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඔහුගේ නිපුණතාවයන් පිළිබඳ නිසි ලේඛන ඉදිරිපත් කළ යුතුය. ESMP සඳහා වන පිරිවැය

වෙනම වැටුප් අයිතමයක් ලෙස දැක්විය යුතුය. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික සහ සමාජ කළමනාකරණ ක්‍රම ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු අතර PMU ඒකකය එය අනුමත කිරීමට නියමිතය.

වගුව 3: ES & HS සමඟ අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරු ගේ අවශ්‍යතාව

| **යොමු අංකය. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වන්ට ESMP** | **අයිතමය** | **ව්‍යාපෘතියට අදාල භාවය** |
|---|---|---|
| **2002 පාරිසරික හා සමාජ අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩ බිම තුල ගබඩා කිරීම | අතිශයින්ම වැදගත් (මාර්ගය දෙපස) |
| 2002.2 2) | ශබ්ද හා කම්පන | අතිශයින්ම වැදගත් (මගීන්,පදිකයන් සහ නිවාස) |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරි තැලීම් හා හානි සිදුවීම | අතිශයින්ම වැදගත්( පහල බෑවුමේ නිවාස) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | අදාළ වේ |
| 2002.2 5) | කසළ බැහැර කිරීම | අදාළ වේ (මාර්ග වෙන්කිරීම්) |
| 2002.2 6) | දූවිලි පාලනය | අදාළ වේ (මගීන්,පදිකයන් සහ නිවාස) |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම | අදාළ වේ |
| 2002.2 8) | ජලය | අදාළ වේ |
| 2002.2 9) | ශාක හා සත්ව විශේෂ | අදාළ වේ |
| 2002.2 10) | භෞතික හා සංස්කෘතික සම්පත් | අදාළ නොවේ |
| 2002.2 11) | පාංශු ඛාදනය | අතිශයින්ම වැදගත්( සිරස් බෑවුම්) |
| 2002.2 12) | පස දූෂණය වීම | අදාළ වේ |
| 2002.2 13) | පොළොව හෑරීම | අදාළ වේ |
| 2002.2 14) | ගල්වල මෙහෙයුම් | අදාළ නොවේ |
| 2002.2 15) | වාහන සහ යන්ත්‍රෝපකරණ නඩත්තුව (දූෂණය) | අදාළ වේ |
| 2002.2 16) | **මහජනතාවට වන බාධා** | අතිශයින්ම වැදගත්(අසල්වැසි ප්‍රජාව) |
| 2002.2 17) | **උපයෝගිතා සේවා සහ මාර්ගයේ ඇති පහසුකම්** | අතිශයින්ම වැදගත්( මාර්ගය සහ ගොඩනැගිලි) |
| 2002.2 18) | **දෘශ්‍ය පරිසරය වැඩි දියුණු කිරීම** | අතිශයින්ම වැදගත්( සෞන්දර්යාත්මකව සංවේදී මාර්ග කොටස්) |
| **2002-5. පාරිසරික අධීක්ෂණය** | මූලික සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරි තැලීම් සමීක්ෂණ) | ස්ථානයේ විශේෂිත සැලැස්මක් යොමු කරන්න |
| | ඉදි කිරීම් අතරතුර සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරි තැලීම් සමීක්ෂණ) | ස්ථානයේ විශේෂිත සැලැස්මක් යොමු කරන්න |
| | වැඩබිමේ මෙහෙයුම් කාලය තුල සමීක්ෂණ | ස්ථානයේ විශේෂිත සැලැස්මක් යොමු කරන්න |
| | වාර්තා කිරීම සහ වාර්තා පවත්වාගෙන යාම | අතිශයින්ම වැදගත් |

| **2003.** සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව | | |
|---|---|---|
| 2003.2 | සුරක්ෂිත සංවිධානය සහ සන්නිවේදනය | අතිශයින්ම වැදගත් (අනාරක්ෂිත බැවුම් / මගීන් / නිවාස / බර යන්ත්‍රෝපකරණ ) |
| 2003.3 | ළමා ශ්‍රමය හා බලකිරීම | අදාළ වේ |
| 2003.4 | ආරක්ෂක වාර්තා සහ අනතුරු පිළිබඳ දැනුම් දීම | අතිශයින්ම වැදගත් |
| 2003.5 | ආරක්ෂක උපකරණ සහ ඇඳුම් පැළඳුම් | අතිශයින්ම වැදගත් |
| 2003.6 | ආරක්ෂාව පරීක්ෂා කිරීම | අතිශයින්ම වැදගත් |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | අතිශයින්ම වැදගත් |
| 2003.8 | සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ පුහුණුව | අතිශයින්ම වැදගත් |
| 2003.9 | යන්ත්‍රෝපකරණ සහ සුදුසුකම් ලත් පුද්ගලයන් | අතිශයින්ම වැදගත් |
| ***අදාළ:*** *මෙම වගන්තිය ඕනෑම ව්‍යාපෘති ස්ථානයකට අදාළ පොදු එකක් ලෙස ව්‍යාපෘති ස්ථානය අදාළ වේ*<br>***අතිශයින්ම වැදගත්: ESMP*** *අදාලව එම ස්ථානයට නිශ්චිතවම ක්‍රියාත්මක වන පරිදි පාරිසරික ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විශේෂ අවධානය යොමු කළ යුතුය.*<br>***ඇතැම් විට අදාල වේ:*** *ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ ව්‍යාපෘති ස්ථානයට පිවිසෙන විට මෙම* ***ESMP*** *ක්‍රියාත්මක කරනු ලැබේ*<br>***අදාළ නොවේ:*** *තොරතුරු අනාවරණය වූ කොන්දේසි යටතේ මෙම ව්‍යාපෘති ස්ථානයට අදාළ විය නොහැක*<br>***විකල්ප:*** *අවශ්‍ය වන්නේ නම් පමණි*<br>***ස්ථානීය විශේෂිත නිරීක්ෂණ සැලැස්මක්:*** *කොන්ත්‍රාත්කරු වන් විසින් සඳහන් කර ඇති අධීක්ෂණ අවශ්‍යතා වලට අමතරව* ***ස්ථානීය*** *විශේෂිත නිරීක්ෂණ සැලැස්මෙහි සඳහන් පරිදි කොන්ත්‍රාත්කරු විසින් අධීක්ෂණය කිරීම සඳහා බැඳී සිටී.*<br>***යොමු කිරීම:*** *කොන්ත්‍රාත්කරු වන්* ***ESMP*** *ක්‍රියාත්මක කිරීම සඳහා බැඳී සිටී.* | | |

### 12.8 නාය ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම

ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අපදා අවම කිරීමේ පියවරයන් පහත සඳහන් පරිදි වේ.

වගුව 4: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනුලබන පියවර

| හානි අවම කිරීමේ අයිතමය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියර | වගකීම් |
|---|---|---|
| **i.**වන ආවරණය එළි කිරීම<br>බැවුම් අස්ථාවර වීමේ අවදානම, ඛාදනය වීමේ බලපෑම අවම කිරීම සඳහා බැවුමේ ඉහල ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, කොන්ත්‍රාත්කරු විසින් වන ආවරණ ඉවත් කිරීමේදී සැලකිලිමත් විය යුතුය. විශාල ලෙස ප්‍රදේශ එළිකිරීම, හිතාමතා හා අනවශ්‍ය ලෙස ගස් කැපීම වැළැක්විය යුතුය | ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **ii.ඉදි කිරීම අතරතුර බාදනයෙන් සිදුවන බලපෑම සහ රොන්මඩ ගලා යාම අවම කිරීම**<br>වැසි කාලය තුළදී ව්‍යාපෘති ස්ථානයේ බැවුම් සකස් කිරිම සුන්බුන් ඉවත් කිරීම ආදී කාර්යයන් සිදු නොකිරීමට නිර්දේශ කර ඇත. එම නිසා වැසි කාලයට පෙර වියළි කාලගුණික තත්ත්වයක දී සිදුකළ හැකි උපරිමය නායයාම අවම කිරීමේ ව්‍යාපෘතිය තුළ ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම අනිවාර්ය වේ. එමෙන්ම වැසි කාලය තුළ ඉහළ බැවුමේ කිසිදු ක්‍රියාකාරකමක් සිදුනොකිරීමට නිර්දේශකර ඇත. මෙය සැලසුම් අදියරේ දී සලකා බැලිය යුතුය.<br>අවදානම අවම කිරීමේ කාර්යේදී බැවුම් භූමි ප්‍රදේශය නිරාවරණය වන අතර, එවිට බාදනයට ලක්වීමෙන් සිදු වන බලපෑම ඉහල තත්වයක පවතී. එබැවින් බාදනය පාලනය කිරීමේ හා රොන්මඩ ගලා යාම අවම කිරීමේ උපාය මාර්ග අනිවාර්ය වේ.උදාහරණ ලෙස තෙත් කාළගුණික අවස්ථා වල විශාල කැනීම් කටයුතු වල නොයෙදීම, වැසි අවස්ථා වල බාදනයට ලක්විය හැකි බැවුම් කොටස් ආවරණය නොකිරීම සහ රොන්මඩ සඳහා බාධක යෙදීම ආදිය දැක්විය හැකිය. | ස්ථාන සකස් කිරිම සහ ඉදිකිරිම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **iii.ආක්‍රමණික විශේෂ**<br>පාංශු බාදනය වලක්වා ගැනීම්ට සුදුසු ශාක හෝ තෘණ වර්ග භාවිතා කළ යුතුය. දේශීය පරිසරයට අයත් ආවේණික ශාක වර්ග තෘණ තෝරා ගැනීම සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **iv.ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම සහ රොන්මඩ ගලා යාම**<br>ඉදිකිරීම් කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විශේෂ අවධානය යොමු කළ යුතුය. එවැනි අපද්‍රව්‍ය ජනනය වූ විට PMU විසින් අනුමත ක්‍රමවේදයන් අනුව සේදී යාම් වලට ලක් නොවන පරිදි ගබඩා කර ඉවත් කල යුතුය.<br>මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා පාෂාණමය ද්‍රව්‍ය භාවිතා කිරීම සලකා බැලිය යුතුය. නමුත් එය මෙම කාර්යයන් සඳහා සුදුසු නොවේ නම්, පාෂාණමය ද්‍රව්‍ය ඉදිකිරීම් ද්‍රව්‍යක් ලෙස භාවිතා කිරීමට උනන්දුවක් දක්වන වෙනත් පාර්ශවයන් වෙත භාවිතා කිරීමට ඉඩ ලබා දිය යුතුය | ස්ථාන සකස් කිරිම සහ ඉදිකිරිම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **v.දූවිලි සහ දූවිලි ආවරණ**<br>අධික දූවිලි උත්පාදනය වන ක්‍රියාකාරකම්කම් ඉතා සැලකිල්ලෙන් කළ යුතු අතර එවන් අවස්ථාවලදී ප්‍රමාණවත් ලෙස ජලය යෙදීමක් මගින් දූවිලි පාලනයට නිර්දේශ කර ඇත. | ස්ථාන සකස් කිරිම සහ ඉදිකිරිම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vi.ඉදිකිරීම් සඳහා ජලය භාවිතය**<br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත ස්ථාන වලින් පමණි. | ස්ථාන සකස් කිරිම සහ ඉදිකිරිම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vii.ප්‍රවාහන හා යටිතල පහසුකම් සඳහා බලපෑම් (විශේෂයෙන් තාවකාලික මාර්ග හා දුම්රිය මාර්ග අහිමි වීම, රථවාහන තදබදය පිළිබඳ අවදානම).**<br>මෙම ස්ථානය සඳහා බෑවුම අස්ථාවර වීමේ අවදානම, අසල ඇති වංගුව සහ අපදා අවම කිරීමේ කටයුතු කෙරෙන බෑවුමේ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් මාර්ග තදබදය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ කළමනාකරණ සැලැස්මක් පිළියෙල කළ යුතුය.<br>දීප්තිමත් වෙන්කිරීම් පටි , මාර්ග ආරක්ෂණ සලකුණු පුවරු, නායයෑම් අවදානම් සංඥා පුවරු, පූර්ණ කාලීන දිවා රාත්‍රී මුරකරු, රාත්‍රී ලාම්පු යන ආදිය සැලසුමෙහි ඇතුලත් විය යුතුය. | ස්ථාන සකස් කිරිම සහ ඉදිකිරිම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **viii.සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව**<br>**ව්‍යාපෘති** කාලය අතරතුරදී සේවකයින් අධි අවදානම් තත්ත්වයක් සහිතව වැඩ කළ යුතු බැවින් එම තත්ත්වය වලක්වා ගැනීමට ESMP වගකීම් මත කොන්ත්‍රාත්කරු ට නිර්දේශිත අංශ 2003 යටතේ " ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව හා සේවා කොන්දේසි" ඉතා | ස්ථාන සකස් කිරිම සහ ඉදිකිරිම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| සැලකිලිමත්ව හා මනා කළමණාකාරීත්වයකින් යුතුව ආරක්ෂිත අධීක්ෂණ පද්ධතියක් මත පවත්වාගෙන යා යුතුය.<br>.<br>i. වැසි සමයේ අස්ථාවර බෑවුම් මත වැඩ කිරීම් ඉතා අවදානම් බැවින් වැසි කාලයේ **ව්‍යාපෘති** කටයුතු සිදු සිදු කිරීම අත්හිටුවීමට වීමට කටයුතු කළ යුතුය.<br>ii. කම්කරුවන්ගේ හා ප්‍රජාවගේ ආරක්ෂාව සඳහා උසස් තත්වයේ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකාවල් යොදාගැනීමයොදාගැනීමට තරයේ නිර්දේශ කොට ඇත.<br>iii. කම්කරුවන් හා මාර්ගය භාවිතා කරන්නන් මත කළු ගල් පෙරළීමේ අවදානම වළක්වා ගැනීමට ආරක්ෂිත බාධක හා දැල් ස්ථාපිත කිරීම් අනිවාර්ය වේ<br>iv. සේවකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් සපයා දිය යුතු අතර, සනීපාරක්ෂක අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කළ යුතුය<br>v. මෙම මාර්ගයේ වංගු කිහිපයක් ඇති බැවින් පූර්ණ කාලීන මුර සේවාවක් යොදාගත යුතුය<br>vi. සෑම අවස්ථාවකදීම කොන්ත්‍රාත්කරු විසින් වාහන සහ පදිකයින් සඳහා ආරක්ෂිත සහ පහසු මාර්ගයන් සැපයිය යුතුය. රථවාහන තදබදයන්හි ආරක්ෂන ක්‍රමවේදයන් සඳහා මාර්ග බාධක සැපයිය යුතුය. | | |
| **ix.වැඩ කරන වේලාවන්**<br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයට පමණක් සීමා විය යුතුය. ආරක්ෂිත ගැටලු නිසා කිසිම හේතුවක් මත ප.ව.6 න් පසු වැඩ කිරීම නිර්දේශ නොකරයි. | ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **x.වැඩ බිම තුලට සාමාන්‍ය පුද්ගලයින් ඇතුළු වීමේ හෝ එම ප්‍රදේශය හරහා ගමන් කිරීමේ අවශ්‍යතාවය**<br>කොන්ත්‍රාත්කරු ගේ සහ පූර්ණ කාලීන මුරකරුගේ සුපරීක්ෂාකාරීත්වය, දැනුවත් කිරීමේ සහ අනතුරු ඇඟවීම් පුවරු මගින් වැඩබිමට සිදුවිය හැකි අනවසර ප්‍රවේශයන් වැළැක්විය යුතුය. | ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xi.දෘෂ්‍ය දූෂණය අවම කිරීම**<br>හොඳ ගෘහපාලනයක් පවත්වා ගත යුතු ය | ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xii.ජල සැපයුම් මාර්ගය**<br>අස්ථායි බෑවුම හරහා ගමන් කරන ජල මාර්ගයන් ඉදිකිරීම් කාර්යයන් අතරතුර බලපෑම් ඇති නොවන සේ නිවැරදිව සවිකල යුතුය. ආපදා අවම කිරීමේ කාර්යයන් පිලිබඳ සහ ජලසම්පාදන මාර්ගයන් ආරක්ෂිත ස්ථානයකට ගෙන යාමේ අවශ්‍යතාවය පිලිබඳ ජලය ලබාගන්නා පුද්ගලයන් දැනුවත් කළ යුතුය. ජලසම්පාදනය මාර්ගයන් ගුරුත්වාකර්ෂණය යටතෙහි ජලය ප්‍රවාහනය කරන බැවින් නැවත ස්ථානගත කිරීමේදී ප්‍රවාහයට බාධා නොවෙන ලෙස කළ යුතුය. කෙසේ වෙතත්, ආපදා අවම කිරීමේ කාර්යයන් අවසන් වන විට පෙර ස්ථානයේ ජලසම්පාදන මාර්ගයන් නැවත ස්ථානගත කළ යුතුය. | ස්ථාන සකස් කිරීම සහ ඉදිකිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

## 13. ව්‍යාපෘති ස්ථානය අධීක්ෂණය කිරීම

ඉදිකිරීම් කාලයේදී මෙම ස්ථානයට නිශ්චිතව දක්වා ඇති පහත දැක්වෙන අධීක්ෂණ සැලැස්ම දැඩි ලෙස අවධාරණය කරනු ලැ‍ෙබ්. මීට අමතරව ඉදිකිරීම් ඉංජිනේරු කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ සඳහන් නිරීක්ෂණ ක්‍රියා පටිපාටිය ද ක්‍රියාත්මක කළ යුතුය.

වගුව 5: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර

| අධීක්ෂණ අවශ්‍යතා | පරාමිතීන් | පරීක්ෂා කලයුතු වාර ගනන |
|---|---|---|
| i.මූලික නිරීක්ෂණ | ඇළ මාර්ගයේ ජලයේ ගුණාත්මකභාවයයි | ප්‍රදේශයේ කාණු පද්ධතිය සහ ආපදා අවම කිරීමේ සැලසුම අධ්‍යනය කිරීමෙන් පසු පමණක් සලකා බැලිය යුතුය. |
| | විශාල අවදානමක් ඇති නිවාස වල පූර්ව ඉරිතැලීම් සමීක්ෂණය | එක් වරක් * |
| | භූමි කම්පන | එක් වරක් * |
| | පසුබිම් ශබ්දය මැනීම | එක් වරක් * |
| | වාතය ගුණාත්මකභාවය: අංශු | එක් වරක් * |
| ii.ඉදිකිරීම් අතරතුර | ඇළ මාර්ගයේ ජලයේ ගුණාත්මකභාවයයි | ප්‍රදේශයේ කාණු පද්ධතිය සහ ආපදා අවම කිරීමේ සැලසුම අධ්‍යනය කිරීමෙන් පසු බැවුම් කැනීම් අතරතුර පොලොවෙහි පස විදීමේ කටයුතු (සෑම මසකම) සලකා බැලිය යුතුය. |
| | විශාල අවදානමක් ඇති නිවාස වල පූර්ව ඉරිතැලීම් සමීක්ෂණය | ඉදිකිරීම් තුළදී සැලකිය යුතු විස්ථාපන(ඇත් වීම්)පවතී ** |
| | භූමි කම්පන | කැණීම් යන්ත්‍රෝපකරණ, පිපිරවීම, හෝ භූ කම්පන ජනනය කරන ඕනෑම ක්‍රියාවක දී * |
| | ඉදිකිරීම් ශබ්දය | අධික ශබ්ද ජනන කාලය තුලදී |
| | වායු ගුණාත්මක අංශු | මසකට වරක්* |
| iii.වායු විමෝචනය | අදාළ සියලු යන්ත්‍රෝපකරණ / වාහන ක්‍රියාත්මක වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය - උපදේශකයාගේ ව්‍යාපෘති ස්ථානයES විසින් පරීක්ෂා කළ යුතුය | |
| iv.නිරීක්ෂණ ආයතනය | * ඉරිතැලීම් සමීක්ෂණය හැර අනෙකුත් සියලුම පරාමිතීන් අධ්‍යනය සඳහා මධ්‍යයම පරිසර අධිකාරියේ ලියාපදිංචි ස්වාධීන නිරීක්ෂණ ආයතනයක් යොදා ගත යුතුය.<br>** PMU අනුමත ආයතනයක් මගින් ඉරිතැලීම් සමීක්ෂණය පැවැත්විය යුතුය | |
| v. අවශ්‍යතා වාර්තා කිරීම | **ගංගා ජල ගුණාත්මය -** මධ්‍යයම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ජල තත්ත්ව ප්‍රමිතීන් සමග සැසදීම, 2017<br>**ඉහල අවදානමක් සහිත ගොඩනැඟිලිවල ඉරිතැලීම් සමීක්ෂණය -** වෘත්තිමය වාර්තාවක්<br>යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම් ක්‍රියාකාරකම් සහ වාහන ගමන්, CEA සඳහා කම්පනය පිළිබඳ අන්තර් ප්‍රමිතීන් අනුව භූමි දෙදරුම් කම්පනය<br>**පසුබිම් ශබ්දය මැනීම -** අතිරේක ගැසට් අංක 924.1, මැයි 23,1996, මධ්‍යයම පරිසර අධිකාරිය<br>**වායු ගුණාත්මය (අංශු පරීක්ෂාව)-** 2008 අගෝස්තු මස 15 වන දින අංක 1562/22 දරන **අති විශේෂ ගැසට් නිවේදනය යටතේ ජාතික පරිසර උෂ්ණත්ව තත්ත්වයන් -** මධ්‍යයම පරිසර අධිකාරිය.<br>**කුඩා වාසස්ථාන ඇගයීම:** TOR හි FD අනුව කුඩා වාසස්ථාන තක්සේරු වාර්තාව: කුඩා වාසස්ථාන මත ඇතිවන බලපෑම අවම කිරීම | |

## 14. දුක්ගැනවිලි වලට සවන් දීම

පහත සඳහන් විය හැකි බලපෑම් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් මෙම **ව්‍යාපෘතියේ** දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා උපදේශකවරුන් වන **ES** නිලධාරියා වගබලා ගත යුතුය (යොමුකිරීම: **දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා නිර්දේශිත ක්‍රියා පටිපාටිය සඳහා පරිසර හා සමාජ කළමනාකරණ රාමුව**).

## 15. තොරතුරු අනාවරණය කිරීම

පහත දැක්වෙන ආයතන සහ සංවිධාන අනුව ලකුණු කරන ලද ආකෘති මගින් ES තොරතුරු අනාවරණය කිරීමට PMU හි වගකීම වේ.

වගුව 6: තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු අනාවරණය කිරීමේ ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය තොරතුරු, සැලසුම, ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන) | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය,DFC, DWLC, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම්,RDA, රාජ්‍ය ඉඩම් හිමියන්, අනෙකුත් දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතායතන, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම්, අනුමැතීන් සහ කැමැත්ත සඳහා අත්සන් කිරීම සඳහා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම. |
| ii. පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, AIIB, | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම්, අනුමැතීන් සහ කැමැත්ත සඳහා අත්සන් කිරීම සඳහා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම |
| iii. ප්‍රගති වාර්තා (මූලික හා ඉදිකිරීම් කාලය තුළ) | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, AIIB සහ අදාළ පාර්ශ්වයන් සුදුසු පරිදි | ප්‍රගති රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| iv. පාරිසරික අනුකූලතා සේවකයින් සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා ස්ථාන පරීක්ෂා කිරීම | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, RDA , ප්‍රාදේශීය ලේඛම්, පොලිස්, රාජ්‍ය ඉඩම් හිමියන්, ගාම නිලධාරී, දිස්තික් කාර්යාලය NBRO, AIIB හා අදාළ පාර්ශ්වයන් | ලිඛිත හා වාචික සන්නිවේදනය, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| v. එ.ජා.ර.ස.ට අදාළ තීරණ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යයම පරිසර අධිකාරිය, RDA , ප්‍රාදේශීය ලේඛම්, පොලිස්, රාජ්‍ය ඉඩම් හිමියන්, ගාම නිලධාරී, දිස්තික් කාර්යාලය NBRO, AIIB හා අදාළ පාර්ශ්වයන් | රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| vi. දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රනය | අදාල පාර්ශ්වයන්, AIIB, | රැස්වීම්,ලිඛිත හා වාචික සන්නිවේදනය |

වගුව 7: තොරතුරු රැස්කර ගැනීම සඳහා සම්බන්ධකර කරගත් ආයතන සහ නිලධාරීන්

| දිනය | ආයතනය | තොරතුරු සඳහා සම්බන්ධ වූ පුද්ගලයා |
|---|---|---|
| 16/10/ 2018 පැය 10.30 | මාර්ග සංවර්ධන අධිකාරිය –<br>රුවන්වැල්ල | H K R A වික්‍රමනායක මහතා<br>විධායක ඉංජිනේරු<br>රුවන්වැල්ල |
| 03/10/2018 පැය 13.00 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කේ ජී සේපාල මහතා<br>දිසා වන නිලධාරී<br>කෑගල්ල දිස්ත්‍රික්කය |
| 03/10/2018 පැය 14.00 | මධ්‍යයම පරිසර අධිකාරිය | එස්. ඩී. ගන්කර්ති මහතා<br>ජේෂ්ඨ පරිසර නිලධාරි -<br>කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය |
| 03/10/2018 පැය 14.00 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව<br>(LRC) | ඩී. සෙන්දනායක මහතා<br>අධ්‍යක්ෂක |

ඇමුණුම **I:** ව්‍යාපෘති ප්‍රදේශයේ ඩ්‍රෝන ඡායාරූපය



*ඇමුණුම* **II:** *ආපදා තත්ත්වයේ ස්වභාවය හා උපදේශන අවස්ථා*



*රූපය a: අධි අවදානම් නිවාස හිමියෙකු වන අබේසිංහ මහතා සමග සාකච්ඡා කිරීම*



*රූපය b: පහල බෑවුමේ පිහිටා ඇති අධි අවදානම් නිවසක්*




*රූපය c: නාය යාමත් සමග ගල් පහලට පෙරලී ඇති අකාරය*



*රූපය d: ඉහල බෑවුමේ පිහිටා ඇති මධ්‍ය අවදානම් නිවසක්*

*ඇමුණුම* **III :** *පාර්ශ්වකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා වලදී අනාවරණය වූ කරුණු*

| දිනය: 13/09/2018 සහ 03.10/2018 | | |
|---|---|---|
| ආයතනය | **සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර** | ඉදිරිපත් වූ සැලකිය යුතු කරුණු |
| මාර්ග සංවර්ධන අධිකාරිය රුවන්වැල්ල | H K R A<br>වික්‍රමනායක මහතා<br>විධායක ඉංජිනේරු<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>රුවන්වැල්ල | මෙම ප්‍රදේශය රුවන්වැල්ල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වේ.විධායක ඉංජිනේරු කාර්යාලය ව්‍යාපෘතියට විරුද්ධත්වයක් නොමැති අතර, ආපදා අවම කිරීම ඉතා අවශ්‍ය වේ.<br>ඉදිරිපත් වූ අනිකුත් කරුණු<br>• මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලැස්ම පිළිගත යුතුය: ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් අවශ්‍ය අනුමැතීන් පිළිබඳ විධිමත් ඉල්ලීමක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය. PMU ඉහත ලිපි ලේඛන සකස් කළ යුතු අතර ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාලයට ලේඛන ඉදිරිපත් කළ යුතුය.<br>• ආපදාව අවම කිරීමෙන් පසුව ව ව්‍යාපෘතිය නිසි පරිදි භාර දීම අවශ්‍ය වේ.<br>• ආපදාව අවම කිරීමකින් පසුව ඉංජිනේරු කාර්යාලය විසින් නඩත්තු කටයුතු කරනු ඇත. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කේ ජී සේපාල මහතා<br>දිසා වන නිලධාරී<br>කෑගල්ල දිස්ත්‍රික්කය | ආපදා අවම කිරීමේ ප්‍රදේශය මෙම ආයතනය යටතේ ආවරණය නොවන නිසා මෙම වැඩබිමෙහි කටයුතු පිලිබද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විරෝධයක් නොමැත. |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWLC) | වනජීවී කාර්යාලයක් දිස්ත්‍රික්කය තුළ පිහිටා නැත | |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව(LRC) | ඩී. සේනානායක මහතා<br>අධ්‍යක්ෂ එල්<br>කෑගල්ල දිස්ත්‍රික්කය | ආපදා අවම කිරීමේ ප්‍රදේශය මෙම ආයතනය යටතේ ආවරණය නොවන නිසා මෙම වැඩබිමෙහි කටයුතු පිලිබද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විරෝධයක් නොමැත. |
| මධ්‍යයම පරිසර අධිකාරිය | එස්.ජී. ඩී. ගන්කර්ති මහතා<br>ජ්‍යේෂ්ඨ පරිසර නිලධාරි - කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය | ✓ ජාතික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ 1996 වර්ෂයේ පාංශු සංරක්ෂණ පනත යටතේ 772/22 වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශ හැරුණු කොට සංවේදී ප්‍රදේශයක් ලෙස ගැසට් කර ඇත.<br>✓ මෙම ගැසට්පත්‍රය යටතේ ව්‍යාපෘතියේ විශාලත්වය නොතකා සියලු සංවර්ධන කටයුතු කිරීම සඳහා අනුමතය දී නොමැත.<br>✓ ව්‍යසනයකදී මෙය අවශ්‍ය නොවේ.<br>✓ ව්‍යාපෘතිය සඳහා අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා මූලික තොරතුරු ප්‍රශ්න පත (BIQ) අවශ්‍ය වේ.<br>✓ ආවේණික ශාක විශේෂ, විශේෂ වාසස්ථාන, ශාක හා සත්ත්වයන් පිලිබදව අධ්‍යනය අවශ්‍ය වේ.<br>✓ අවම කිරීමෙන් පසුව ඇති වන වෙනස සංසන්දනය කිරීම සඳහා මෙම පාරිසරික ඇගයීම අවශ්‍ය විය හැකිය. |

| | | |
|---|---|---|
| | | ✓ මධ්‍යයම පරිසර අධිකාරිය නිර්දේශ සහිතව අනුමැතිය ලබා දෙනු ඇත. |

*ඇමුණුම* **IV:** *රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රමවේදය*

**1.නායයාම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාපටිපාටිය**

ව්‍යාපෘති සම්පාදන අදියරේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික - සමාජ සහ සෞඛ්‍යය - ආරක්ෂක ඒකකය විසින් ස්ථානයට විශේෂිත වූ පාරිසරික සමාජ කළමනාකරණ සැලැස්ම අධ්‍යනය කරනු ලබන අතර මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය වෙත ව්‍යාපෘති යෝජනාව සහ ව්‍යාපෘතියට අදාළ ස්ථානයට විශේෂිත වූ පාරිසරික සමාජ කළමනාකරණ සැලැස්ම ඉදිරිපත් කළ යුතුය.

i. මූලික තොරතුරු ප්‍රශ්නාවලියක් (BIQ) ලෙස ඉහත විස්තර සමග සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.
ii. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතිය පිළිබඳ කිරීමට සහ ස්ථානයට විශේෂිත වූ පාරිසරික සමාජ කළමනාකරණ සැලැස්ම පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කැඳවිය හැක.
iii. ව්‍යාපෘතිය මගින් ස්ථානයට විශේෂිත වූ නිශ්චිත කොන්දේසි වලට යටත්ව ව්‍යාපෘති යෝජනාව අනුමත කරනු ලැබේ.

*ඇමුණුම* **V:** *අධ්‍යන කණ්ඩායම*

| නම | තනතුර | අධ්‍යයනයෙහි කාර්යභාරය |
|---|---|---|
| DSV ඩයස් | අධ්‍යක්ෂක / ESSD / NBRO | කණ්ඩායම් නායක |
| SAMS දිසානායක | ජ්‍යේෂ්ඨ විද්‍යාඥ/ ESSD / NBRO | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ |
| P ලියනආරච්චි | විද්‍යාඥ/ ESSD / NBRO | පාරිසරික විද්‍යාඥ |
| H. කුලසිරි | කාර්මික නිලධාරි / ESSD / NBRO | GIS / ජනගහන දත්ත / සමීක්ෂණ ආධාර |
| දිල්හානි ජයලත් | භාර නිලධාරි / කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය | භූ විද්‍යාඥ |
| ජයවර්ධන ජයමාන්න | විද්‍යාඥ/ LRRMD / NBRO | භූ විද්‍යාඥ |

*ඇමුණුම* **VI:** *යොමු සටහන් ලැයිස්තුව*

1.රුවන්වැල්ල - වේයන්ගොඩ මාර්ගයේ ගොනගල්දෙනිය ප්‍රදේශයේ නායයෑමේ අවදානම පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාව (NBRO / LRRMD / KG / RWP / L117 / 31/30080)

2.ගෝලීය පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම සඳහා කොන්ත්‍රාත්කරු ගේ වගකීම් - ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය - AIIB

3.පරිසර හා සමාජ කළමනාකරණ රාමුව - ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය _AIIB

4.නැවත පදිංචි කිරීමේ සැලසුම් රාමුව - ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය _AIIB